**මාසික මහ සභා රැස්වීම් වාර්තාව**

ස්ථානය :- රඹුක්කන ප්‍රාදේශීය සභාව
දිනය :- 2026.01.06
වේලාව :- පෙ.ව. 10.00

**සහභාගිත්වය**

ගරු සභාපති ,
1. ආර්.එම්.එස්.එස්.බි.රත්නායක මැතිතුමා

ගරු උපසභාපති ,
2.ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී/මන්ත්‍රිනී,

3. වයි.ජී.ජයවීර මැතිතුමා
4. ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා
5. ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය
6. පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා
7. එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා
8. එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා
9. එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා
10. කේ.සී.සරත් කුමාර මැතිතුමා
11. එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා
12. ජේ.පී.පද්මසිරි මැතිතුමා
13. එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා
14. පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය
15. එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා
16. එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා
17. ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා
18. එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා
19. එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා
20. වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමිය
21. එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
22. ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා
23. ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
24. පී.ජී.මල්ලිකා මැතිතුමිය
25. ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා
26. එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
27. පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා
28. එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා
29. කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා
30. වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා
31. පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා
32. එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය
33. ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය
34. එම්.ආර්.එන්.එම්.ජයසුන්දර මැතිතුමිය
35. ඩී.එල්.සී.සිසිර කුමාර මැතිතුමා
36. ඩබ්.ජී.ජයතිස්ස මැතිතුමා
37. ඩබ්.ජී.කරුණාවතී මැතිතුමිය

**නිලධාරී සහාභාගිත්වය**

❖ ආර්.ජී.එස්.නිරෝෂන් මයා - ලේකම්

**ආගම සිහිකිරීම**

රැස්වීමට පැමිණ සිටි සියලුදෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

**(අ) 2025.12.02 දින පැවති මාසික මහා සභා වාර්තාව සම්මත කිරිම.**

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2025.12.02 දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරිම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ද එසේ නොමැති නම් 2025.12.02 දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීම් වාර්තාව ලියා ඇති පරිදි සභා සම්මත කරන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**සංශෝධන**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

පිටු අංක 09 හි සඳහන් නගර නිවාස යෝජනාවේ සභාපතිතුමා විසින් ඉදිරිපත් කර ඇති ප්‍රකාශය ගැළපිමක් නැති බව සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ලිපිගොනු පරීක්ෂා කිරීමේදී හෙලි වූ තොරතුරු අනුව එම ප්‍රකාශය සිදු කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

යෝජනාවක් සම්බන්ධව සංශෝධන ඉදිරිපත් වූ අවස්ථාවකදී අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය යන්න යෙදීම කොතෙක් දුරට සාධාරණ දැයි විමසන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

යම් යෝජනාවක් සම්බන්ධයෙන් වාද විවාදය ඉදිරිපත් වුවද එම අදාළ සංශෝධන යෝජනාවක් ලෙස ලේකම්වරයාගේ අත්සනින් යුතුව සභාවට ඉදිරිපත් කළ යුතු බවත්,එවිට එම සංශෝධන යෝජනාව බලාත්මක බවත් අදාළ රීති 21වගන්තිය අධ්‍යයනය කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

පිටු අංක 26 හි ඉලුක්ගල්ල ලෙස සටහන් වී ඇති නම ඉලුගල්ල ලෙසත්,පිටු අංක 27 හි සඳහන් පර්යේෂණයක් නොව පරීක්ෂණයක් ලෙස සටහන් විය යුතු ලෙසත් සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

පිටු අංක 05 හි සඳහන් තෙන්නකෝන් මන්ත්‍රීතුමා සභාගර්භයෙන් ඉවත් කළ යුතු යැයි උපසභාපතිතුමන් විසින් ප්‍රකාශ කළ පසුව තමා එය එසේ සිදු නොකළ යුතුයැයි ප්‍රකාශ කළ නමුත් වාර්තාවේ එය සටහන් වී නොමැති බව සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

එවැනි ප්‍රකාශයක් ඒ මොහොතේ ඔබතුමන් විසින් (සමීර ධර්මසේන මන්ත්‍රීතුමා) ප්‍රකාශයට පත් නොකළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

පිටු අංක 05 හි සටහන් ප්‍රකාශයේ රීති 20 (vii) යටතේ සභාවට ඉදිරිපත් කළ යෝජනාවක් සංශෝධනය කර ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මාස 06 ක් යන තෙක් නැවත සභාවට ඉදිරිපත් කළ නොහැකි බව ප්‍රකාශ කළ බව ප්‍රකාශ කරන ලදී. එතුමා ගෙනා යෝජනාව මෙහි ඇතුළත් නොවන බවද සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදී

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පසුගිය සභා වාර්තාවේ තමන් ඉදිරිපත් කළ අදහසක් ඇතුළති වී නොමැති නම් එය ඇතුළත් විය යුතු ස්ථානය හා ආකාරයත් ඇතුළත් වී ඇති ප්‍රකාශයක කිසියම් නිවැරදි කිරීමක් අවශ්‍ය නම් එම නිවැරදි කිරීමත් සංශෝධන අවස්ථාවේදී ඉදිරිපත් කරන ලෙසත්,අනවශ්‍ය ලෙස තර්කය ඉදිරිපත් නොකරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.වෙනත් කිසිදු සංශෝධන නොමැති නම් වාර්තාව සභා සම්මත කරන ලෙස ඉල්ලා සිටින ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා**

2025.12.02 දින මහසභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඒ අනුව 2025.12.02 දින මහසභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමන් විසින් ගරු මහසභාවට ප්‍රකාශ කරන ලදී.

(ආ). සභාපතිතුමා විසින් කරන ලද විශේෂ නිවේදන

01. 2026.01.01 දින හා CLG/LG 5/3/1(iv වෙළුම) අංක දරණ පළාත් පාලන දෙපාර්තමේන්තුව සබරගමුව විසින් එවන ලද පළාත් පාලන ආයතන සතු වෙළෙඳපොළ,සතිපොළ දිනපතා පොළ,කඩකාමර,විවිධ කඩ කාමර බදු දීම හෝ කුලියට දීම සම්බන්ධ ලිපිය සභාවට ඉදිරිපත් කළ අතර එම ලිපියෙහි පිටපතක් සෑම මන්ත්‍රීතුමෙකුටම ලබාදීමට කටයුතු කරන ලදී.

02. 2008.06.08 දින ප්‍රකාශයට පත් කරන ලද ගැසට් පත්‍රයෙහි ප්‍රකාරව සභික දීමනාව ලබා ගැනීමට සපුරාලිය යුතු සුදුසුකම් සම්බන්ධව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

රු23,000/= ක දීමනා රු15,000/= වූ බවත්, ඒ සම්බන්ධවද නැතිනම් රු8000/= ක ගමන් වියදම් හා දුරකථන දීමනා සම්බන්ධව ද යන්න විමසන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මාසිකව ලැබෙන සභික දීමනාව සම්බන්ධව බව ප්‍රකාශ කරන ලදී.

03. පොහොසත් රටක් ලස්සන ජීවිතයක් නිකසල පුරයක් - සුවබර දිවියක් තේමාව පෙරදැරි කරගෙන රාජ්‍ය පරිපාලන පළාත් සභා පළාත් පාලන අමාත්‍යාංශය විසින් 2026 ජනවාරි මස 07/08/09 යන තෙදින පසු ආපදා පවිත්‍රතා සහ ඩෙංගු මර්ධන ජාතික වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන බව දන්වා ලිපියක් එවා ඇති බවත්,ඒ අනුව රඹුක්කන බල ප්‍රදේශය ඩෙංගු වලින් තොර කලාපයක් බවට පත් කිරීම හා පවත්වාගෙන යාමට ඔබතුමන්ලාගේ සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී. තවද,ඒ සම්බන්ධව වැඩිදුර තොරතුරු විෂය භාර නිලධාරී නයෝමි මහත්මියගෙන් ලබා ගත හැකි බවත්,සමාරම්භක අවස්ථාවට පැමිණ ගම්මට්ටමින්ද මෙම වැඩසටහන ක්‍රියාවට නංවන ලෙස දන්වන ලදී.එසේම පසු විපරම් කිරීමේ වගකීම මහජන නියෝජිතයින් වන මන්ත්‍රීතුමන්ලා/ තුමියන්ලාට පැවරෙන බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

(ඇ).සභා රැස්වීමේ නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා - නැත

(ඈ).සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරිම.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සංදේශ හෝ පෙත්සම් සභාවට ඉදිරිපත් කිරීමට ප්‍රථම එහි නම , ලිපිනය අත්සන පවතීද යන්න සොයා බලා රීතිය අනුව කටයුතු කරන ලෙසත්,කාලය අපතේ නොයන ලෙසත් තරයේ ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

විශ්‍රාමික ගුරු මහත්මිය විසින් හලාගිරිය හටන්හිංන සිට මුවපිටිය දක්වා දිවෙන අතුරු මාර්ගය අබලන් බවත්,එම මාර්ගය පැතිබැම්මක්ද යොදා සංවර්ධනය කර දෙන ලෙසත්,එම මාර්ගයට බස් රථයක්ද යෙදවීමට අවශ්‍යය කටයුතුත් සිදුකර දෙන ලෙසත්,ගම්වාසින්ගේ අත්සන් සහිත ලිපි දෙකක් සභාවට ඉදිරිපත් කරන ලදී.

(ඉ).යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න - නැත

**(ඊ).යථා පරිදි කල් දී ඇති යෝජනා**

**(ඊ).01.ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

i. 2026 වර්ෂය සඳහා රඹුක්කන ප්‍රාදේශීය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව ,නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව,කාර්මික සේවා කාරක සභාව,පරිසර හා පහසුකම් සැපයීමේ කාරක සභාව සඳහා පහත සඳහන් වන පරිදි සභාපතිවරු හා සාමාජිකයින් පත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

- මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව

ප්‍රාදේශිය සභා අරමුදලේ ආදායම් හා වියදම්ද, ඇතුළුව ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට අදාලව ප්‍රාදේශීය සභාවට උපදෙස් දීම සඳහා හා ඊට අදාලව ප්‍රාදේශීය සභාව විසින් කලින් කළ පවරන බලතල හා කාර්යයන් ඉටු කිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති කාරක සභාව නමින් යුත් කාරක සභාවක් විය යුතුය යන්න හා එම කාරක සභාවේ සංයුතිය පහත උපලේඛනයේ ආකාරයට වියයුතු බවටත්,යෝජනා කරමි.

| | | |
|---|---|---|
| 1. ගරු සභාපති | ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා | සභාපති |
| 2.ගරු උප සභාපති | ඒ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා | සාමාජික |
| 3.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා | සාමාජික |
| 4.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ආර්.එස්.කුමාර රමණායක මැතිතුමා | සාමාජික |
| 5.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එම්.බී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා | සාමාජික |
| 6.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එම්.එන්.මොහොම්බදු සුක්රි මැතිතුමා | සාමාජික |
| 7.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා | සාමාජික |
| 8.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය | සාමාජිකා |
| 9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ඒ.ඒ.තරංග නුවන් ප්‍රසංග මැතිතුමා | සාමාජික |
| 10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා | සාමාජික |
| 11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා | සාමාජික |

**බාහිර පාර්ශවය**

| | | |
|---|---|---|
| 12.ව්‍යවසායක | ජගත් චාමික උදය කුමාර මයා | සාමාජික |
| 13. විශ්‍රාමික පොල් සංවර්ධන නිලධාරි | ආර්.නිමල් වීරසිංහ මයා | සාමාජික |
| 14. ව්‍යාපාරික | රූමි මොහොමඩ් | සාමාජික |

- නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාව

ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ නිවාස හා ඔවුනගේ සුබ සාධනය,සුඛවිහරණය,සුවපහසුවද ඇතුළුව ඊට අදාළ ප්‍රජා කටයුතු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට අදාලව ප්‍රාදේශීය සභාවට උපදෙස් දීම සඳහා හා ඊට අදාලව ප්‍රාදේශීය සභාව විසින් කලින් කළ පවරන බලතල හා කාර්යයන් ඉටු කිරීම සඳහා නිවාස සහ ප්‍රජා සංවර්ධනය කාරක සභාව නමින් යුත් කාරක සභාවක් විය යුතුය යන්න හා එම කාරක සභාවේ සංයුතිය පහත උපලේඛනයේ ආකාරයට විය යුතු බවටත්, යෝජනා කරමි.

| | | |
|---|---|---|
| 1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | වයි.ජී.ජයවීර මැතිතුමා | සභාපති |
| 2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | ඩබ්.එන්.එස්.සෝමදාස මැතිතුමිය | සාමාජිකා |
| 3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා | සාමාජික |
| 4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | වී.ආර්.ඊ.එන්.වීරබණ්ඩාර මැතිතුමිය | සාමාජිකා |
| 5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එන්.ඒ.එස්.විමලරත්න මැතිතුමා | සාමාජික |
| 6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | ජී.ජී.මල්ලිකා මැතිතුමිය | සාමාජිකා |
| 7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා | සාමාජික |
| 8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ඩබ්.ජී.ජයතිස්ස මැතිතුමා | සාමාජික |

**බාහිර පාර්ශවය**

| | | |
|---|---|---|
| 9.ව්‍යාපාරික | භාෂිත දසනායක මයා | සාමාජික |
| 10.විශ්‍රාමික විදුහල්පති | එම්.ආනන්ද නිලමේ මයා | සාමාජික |
| 11.ව්‍යාපාරික | ඉන්දික කුඩාගම මයා | සාමාජික |
| 12.ව්‍යාපාරික | අජිත් සංජීව හෙට්ටිආරච්චි මයා | සාමාජික |
| 13.තේ පර්යේෂණාගාරයේ පුස්ථකාලපති | නිලන්ත රණතුංග මයා | සාමාජික |

- **කාර්මික සේවා කාරක සභාව**

ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ සභාව විසින් ක්‍රියාත්මක කරනු ලබන,ක්‍රියාත්මක කිරිමට යෝජිත සංවර්ධන ව්‍යාපෘති හා සභාවේ කාර්ය කටයුතු සිදු කිරිමේ දී අවශ්‍ය සියලු තාක්ෂණික කරුණු ද අතුළුව ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ බලතල ,කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට අදාලව ප්‍රාදේශීය සභාවට උපදෙස් දිම සඳහා හා ඊට අදාලව ප්‍රාදේශීය සභාව විසින් කලින් කළ පවරන බලතල හා කාර්යයන් ඉටු කිරිම සඳහා කාර්මික සේවා කාරක සභාව නමින් යුත් කාරක සභාවක් විය යුතුය යන්න හා එම කාරක සභාවේ සංයුතිය පහත උපලේඛනයේ ආකාරයට විය යුතු බවටත්, යෝජනා කරමි.

| | | |
|---|---|---|
| 1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා | සභාපති |
| 2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එම්.ආර්.අයි.සමන් කුමාර මැතිතුමා | සාමාජික |
| 3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා | සාමාජික |
| 4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | කේ.සී.සරත් කුමාර මැතිතුමා | සාමාජික |
| 5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය | සාමාජිකා |
| 6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ඒ.කේ.එම්.අනීස් මැතිතුමා | සාමාජික |
| 7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | පී.ජී.එන්.ප්‍රියන්ජිත් රාජපක්ෂ මැතිතුමා | සාමාජික |
| 8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා | සාමාජික |
| 9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ඩී.එල්.සී.සිසිර කුමාර මැතිතුමා | සාමාජික |

**බාහිර පාර්ශවය**

| | | |
|---|---|---|
| 10.ඉංජිනේරු | අයි.වසන්ත ජයලත් මයා | සාමාජික |
| 11.ඉංජිනේරු | නිහාල් කොඩිතුවක්කු මයා | සාමාජික |
| 12. ඉංජිනේරු | ඩබ්.කේ.ඒ.එස්.චන්ද්‍රරත්න මයා | සාමාජික |
| 13.ව්‍යාපාරික | ඩී.පී.මීගාර පතිරණ මයා | සාමාජික |

- **පරිසර හා පහසුකම් සැපයිමේ කාරක සභාව**

ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ පරසරයට අදාළ සියලු කටයුතු හා ජනතා සේවා සැපයිමේදී ජනතාවට අවශ්‍ය සියලු පහසුකම් ද ඇතුළුව ඊට අනුයාත කරුණු සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්ය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට අදාලව ප්‍රාදේශීය සභාවට උපදෙස් දිම සඳහා හා ඊට අදාලව ප්‍රාදේශීය සභාව විසින් කලින් කළ පවරන බලතල හා කාර්යයන් ඉටු කිරිම සඳහා පරිසර සහ පහසුකම් කාරක සභාව නමින් යුත් කාරක සභාවක් විය යුතුය යන්න හා එම කාරක සභාවේ සංයුතිය පහත උපලේඛනයේ ආකාරයට වියයුතු බවටත්,යෝජනා කරමි.

| | | |
|---|---|---|
| 1. ගරු උප සභාපති | ඒ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා | සභාපති |
| 2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එච්.අයි.ඩී.හත්තාගොඩ මැතිතුමා | සාමාජික |
| 3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ජේ.පී.පද්මසිරි මැතිතුමා | සාමාජික |
| 4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය | සාමාජිකා |
| 5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | ගාමිණී සමරකෝන් මැතිතුමා | සාමාජික |
| 6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා | සාමාජික |
| 7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | වී.ආර්.එන්.බණ්ඩාරනායක මැතිතුමා | සාමාජික |
| 8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා | සාමාජික |
| 9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී | එම්.ආර්.එන්.එම්.ජයසුන්දර මැතිතුමිය | සාමාජිකා |

| | | |
|---|---|---|
| 10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී | ඩබ්.ජී.කරුණාවති මැතිතුමිය | සාමාජිකා |
| **බාහිර පාර්ශවය** | | |
| 9.මහජන සෞඛ්‍ය පරික්ෂක | චරිත් කරුණාරත්න මයා | සාමාජික |
| 10.සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි | වෛද්‍ය අසංක මයා | සාමාජික |
| 11.වෛද්‍ය නිලධාරි | වෛද්‍ය රෝෂාන් ජයකොඩි මයා | සාමාජික |
| 12.ව්‍යාපාරික | ලසන්ත වික්‍රමරත්න මයා | සාමාජික |

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මාසයකට වරක් කමිටුව පවත්වා සක්‍රියව තබාගන්නා ලෙසත්,නිශ්චිත දිනයක් නම් කර කමිටු සභාපති විසින් තීරණය කර සාමාජිකයින් දැනුවත් කරන ලෙසත් ප්‍රකාශ කරන ලදී.මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාව සෑම සතියකම සිකුරාදා දින පැවැත්වෙන බව වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ඉහත සඳහන් කර ඇති කාරක සභා සඳහා යෝජනා කර ඇති සභාපතිතුමන්ලා හා සාමාජිකයින් හා බාහිර පාර්ශවය සුදුසු බවට තීරණය විය.

ii. මෙම සභාව සතු නව පළමු සංකීරණයේ පිහිටි හිස් ඉඩ කඩෙහි ඉදිකර ඇති කඩ කාමර සම්බන්ධයෙන් 2025.11.19 දින පෙ.ව.10.00 පිහිට වූ කමිටුවේ කමිටු වාර්තාව මහ සභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

කී මනි මුදලක් ලබාගෙන මෙම හිස් ඉඩකඩ ලබා දී ඇති බවත්,එය කොටස් වශයෙන් අදාල කඩ හිමියන් ගෙවා ඇති බවත්,ඉතිරි මුදල් නොගෙවා පැහැර හැරීම නිසා මෙම කරුණ ගැන පළාත් පාලන සහකාර කොමසාර්ස් විසින් සාකච්ඡාවට භාජනය වූ බවත්,ඒ අනුව මෙම කමිටු 08.21 දින පත්කළ බවත් 2025.11.19 වන දින පෙ.ව.10.00 කමිටු සාමාජිකයින් වන

01. උප සභාපතිතුමා - ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා
02. ගරු මන්ත්‍රී - පී.එම්.ආර්.ප්‍රියමාල් දසනායක මැතිතුමා
03. ගරු මන්ත්‍රී - ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා
04. ගරු මන්ත්‍රී - පී.ජී.ආර්.කේ.සුමනරත්න මැතිතුමා
05.විෂය නිලධාරි - කේ වී.රේණුකා දමයන්ති මිය

රැස් වී කරුණු සොයා බැලූ බවත්, එවිට පහත තොරතුරු සොයාගත් බවත්,

01.2022.09.13 මහාසභා වාර්තාව අනුව මෙම කාමර ටෙන්ඩර් කිරීමට තීරණය කරනු ලැබුවද එම කඩ කාමර 03 ම සැලසුමේ අන්තර්ගත වී නොතිබිණි.

02.ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අවස්ථා දෙකක් වේ.(ප.පා.කො.01/2023 චක්‍රලේඛයේ සඳහන් පරිදි) එනම් පළාත් පාලන ආයතනය විසින් ඉදි කරන කඩකාමර දීර්ඝ කාලීනව බදු දීම සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ගනු ලබන තක්සේරු වටිනාකම පදනම් කරගෙන ලංසු කැඳවීම හා
පළාත් පාලන ආයතනයේ අරමුදල් සමඟ බාහිර පාර්ශ්වයන් වෙතින් ලබා ගනිමින් ඉදිකරනු ලබන කඩකාමර හෝ වෙළෙඳ සංකීර්ණ සම්බන්ධයෙන් සැලැස්ම හා ඊට අදාළ ඇස්තමේන්තු පදනම් කරගෙන ලබාගත් රජයේ තක්සේරුවක් පදනම් කර ගනිමින් ඊට අදාළ පාර්ශවයන් තෝරා ගැනීමට ලංසු කැඳවීම.

03.නමුත් මෙහිදී සිදු වී ඇත්තේ මෙම ටෙන්ඩර් ක්‍රියාවලියට පරිබාහිර වූ ක්‍රියාවලියකි.ඒ අනුව ටෙන්ඩර් ක්‍රියාවලියේදී ලංසුකරුවාට ලබා දෙන ප්‍රසම්පාදන කොන්දේසි පත්‍රයේ සභාපතිතුමා විසින් අත්සන් කර අනුමත කර දී නොමැති වීමත් ගැටලු සහගතය.

04.මේ සියලු කරුණු සලකා බැලීමෙන් පසු කමිටු සාමාජිකයින් විසින් අදාළ කාමර පරීක්ෂාවක් සිදු කරන ලදී.

05.එහිදී නිරීක්ෂණය වූයේ නව වෙළෙඳ සංකීර්ණය බිම් මහල දකුණු පස තරප්පු පෙළ යට පිහිටි හිස් ඉඩ කඩෙහි ඉදිකර ඇති කාමර පරිශ්‍රය එක් කොටසක් පවත්වාගෙන යාම සුදුසු බවත්,ඊට යාබද තරප්පු පෙළ යට පිහිටි කාමර පරිශ්‍රය කඩ කාමරයක් පවත්වාගෙන යාමට නුසුදුසු බවත්ය.

06.එසේම නව වෙළෙඳ සංකීර්ණයේ බිම් මහල වම් පස තරප්පු පෙළ යට පිහිටි හිස් ඉඩකඩ ඉදිකර ඇති කාමර පරිශ්‍රය අප විසින් පරීක්ෂා කරන මොහොතෙත් වතුර ගලා යමින් පැවැති අතර වැස්සට තෙමෙන හෙයින් මෙම කාමර පරිශ්‍රය කඩ කාමරයක් පවත්වා ගෙන යාමට නුසුදුසුය.

07.නව වෙළෙඳ සංකීර්ණය ඉහළ මහලා අංක 14 කඩ කාමරයට යාබද හිස් ඉඩකඩෙහි ඉදිකර ඇති කාමරය සම්බන්ධව තරප්පු පෙළ අසලම මෙම කාමරය පිහිටුවා ඇති හෙයින් අනෙකුත් වෙළඳසැල් සඳහා බඩුබාහිරාදිය රැගෙන යාමට බාධා ඇති වීමත් දක්නට ලැබිණි.

08.එහෙයින් ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් ප්‍රසම්පාදන ක්‍රියාවලියේත් ගැටළු සහගත හෙයින්ද ගන්නා ලද තීන්දු වල අඩුපාඩුද පවතින හෙයින්ද මේ පිළිබඳ විධිමත් විමර්ශනයක් සඳහා ගරු ආණ්ඩුකාරතුමියට යොමු කරන ලෙස කමිටු සාමාජිකයින් යෝජනා කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

නෛතික ක්‍රියාවලිය ගැන සභාපතිතුමන් පැහැදිලි කිරීමක් සිදුකළ බව ප්‍රකාශ කරන ලදී.අතීතයේ පැවති දේශපාලන ස්වභාව මනාව පිළිබිඹු වන අවස්ථාවක් ලෙස මෙය දැක්විය හැකි බවත්,හිටපු සභාපතිතුමා අත්තනෝමතිකව තීන්දු තීරණ ගෙන ඇති බවත්,එම නිසා වර්තමානය වන විට ගැටලු රැසකට මුහුණ දී ඇති බවත්,අනිවාර්යයෙන්ම මෙවැනි ක්‍රියාමාර්ග මර්ධනය කිරීමට අවශ්‍ය බැවින් නීතිමය ක්‍රියාමාර්ග ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

එකල පැවති සභා අවස්ථාවලදී ප්‍රජාතන්ත්‍රවාදය නොතිබූ බවත්,තම අදහස් ප්‍රකාශ කිරීමට මෙසේ අවස්ථාව නොලැබුණු බවත්,එකල ද තමා අසාධාරණයන්ට විරුද්ධව කතා කළ බවත්,නමුත් ඒවා වාර්තාගත නොවූ බවත් ප්‍රකාශ කරන ලදී.තවද,මෙම කඩ කාමර 03 සම්බන්ධව කතා කළ ද වෙළෙඳ සංකීර්ණයේ ඉහළ කඩකාමර වර්ෂා කාලයේ දී තෙමෙන බවත්,අවස්ථා කිහිපයකදීම ඒ පිළිබඳව සභාව දැනුවත් කළ බවත්, ඔබතුමන්වත් දැනුවත් කිරීමට මෙය අවස්ථාවක් කරගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.තවද, කුලී ගෙවා ඇති නමුත් වසා ඇති කඩ නැවත විවෘත කිරීමට අවශ්‍ය ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරදීම සුදුසු බවත් තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
ප්‍රසම්පාදන ක්‍රියාවලිය ගැටළු සහගත හෙයින් ද ගන්නා ලද තීන්දුවල අඩුපාඩු පවතී හෙයින්ද මේ පිළිබඳව විධිමත් විමර්ශනයක් සඳහා ගරු ආණ්ඩුකාරතුමියට යැවීම සුදුසු බව කමිටුව යෝජනා කරන බව ප්‍රකාශ කරන ලදී.මේ  සම්බන්ධව ගැටලුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමස ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

විධිමත් පරීක්ෂණයක් සඳහා ගරු ආණ්ඩුකාර තුමිය වෙත යොමු කිරීමට තීරණය විය.

iii. 2025.01.24 දින පැවති පුස්තකාල උපදේශන කමිටු තීරණයට අනුව සංස්කෘතික මධ්‍යස්ථානය මඟින් පවත්වන නැටුම් හා සංගීත පංති පැවැත්වීම සඳහා ප්‍රාදේශිය සභා ශ්‍රවණාගාරය ලබාදීම (පංති පවත්වනු ලබන්නේ නොමිලයේ වන අතර නගරයේ වෙනත් සුදුසු ස්ථානයක් නොමැති බව සංස්කෘතික නිලධාරි පවසයි.)සුදුසු බවට තීරණය වූ අතර මහ සභාවේ අනුමැතිය සඳහා යෝජනා කරමි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මෙම යෝජනාව ඉල්ලා අස්කර ගන්නා බව ප්‍රකාශ කරන ලදී,

iv. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත සින්නක්කරව පැවරී ඇති ඇත්වටේ වත්ත නිවාස ක්‍රමයේ මාර්ගය ඇතුළු පොදු දේපළ සභාව වෙත සින්නක්කරව ලබාදීම සඳහා සම්මුති එකඟතාවය අවශ්‍ය බැවින් මහසභා අනුමතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  එම්.එන්.මොහම්මදූ සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
නිවාස සංවර්ධන අධිකාරිය විසින් එවා ඇති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.ඒ අනුව ඇත්වටේවත්ත නිවාස යෝජනා ක්‍රමයෙහි පවතින පොදු මාර්ග හා පොදු දේපළ සභාව වෙත සින්නක්කරව ලබාදීමට සම්මුති එකඟතාවය අවශ්‍යය බව දන්වන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**
1973 වර්ෂයේදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් අක්කර 50 ට වැඩි ඉඩම් අත්පත් කරගත් බවත්, ඇත්වටේවත්ත කීර්තිරත්න මහතාට අයිති බවත්, ආනන්ද සිරිසේන මහතා අක්කර ½  බැගින් ලණු ඇද ලබාදුන් බවත්, 1977 ආණ්ඩුව පැරදීමත් සමඟම ඇත්වටේ නිවාස ක්‍රමය ලෙස ආර්.ප්‍රේමදාස මහතාගේ අමාත්‍යාංශ යටතේ නිවාස කීහිපයක් ඉදි කළ බවත්,සින්නක්කර අයිතියක් නැති බවත්,නිවාස සංවර්ධන අධිකාරියට ලබාදුන්නේ නිවාස ඉදිකිරීමට පමණක් බවත්,ඔප්පු තිරප්පු මෙතෙක් මුදල් ගෙවා අවසන් අයටවත් ලබාදී නොමැති බවත් ප්‍රකාශ කරන ලදී.තවද, එම ඉඩම් හිමියන්හට ඔප්පු තිරප්පු ලබාදීමට අවශ්‍ය කටයුතු සභාවක් හැටියට මැදිහත් වී සිදු කළ හැකි නම් ඉතා වටිනා බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**
තෙන්නකෝන් මැතිතුමාගේ පැහැදිලි කිරීම සම්බන්ධව ප්‍රශංසා කළ අතර ඇත්වටේ වත්ත නිවාස ක්‍රමයේ පහළ ප්‍රදේශයේ මැතිවරණ නිවාස නිවාස සංවර්ධන අධිකාරියට අයත් බවත්, ඉහළ පිහිටි නිවාස ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් බවත් (LRC) ප්‍රකාශ කළ අතර ඉහළ කොටසෙහි ජනප්‍රවාදය අනුව පතලක් තිබූ බවත්, එහි දෝනා හතරක්,

01. ආදාහනාගාරය දෙසටත්,
02. මුතු බණ්ඩාගේ කඩේ දෙසටත්,
03. රඹුටන් වත්ත දෙසටත්,
04. අශෝක විද්‍යාලය දෙසටත්.

පැවැති බවත්, පාරිසරික සාධක නොතකා මෙම නිවාස ක්‍රමය ආරම්භ කර ඇති බවත්, අවදානම් තත්ත්වයක පවතින බවත්, කිසිදු නිවාසයකට ඔප්පු ලබාදී නොමැති බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

රඹුක්කන කොට්ඨාශයේ ජනතාව බැවින් ඔවුන්ට සාධාරණයක් සිදු කළ යුතු බවත්, නීත්‍යානුකූල භාවය ගැන ගැටලුවක් පවතින බව පෙනී යන බවත්, ඒ සම්බන්ධව අදාළ ආයතන දැනුවත් කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

දෝනා පැවති නිසා මහීපාල මහතා එහි තට්ටු නිවාස ඉදිකිරීමට අනුමැතිය ලබා නොදුන් බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

කරුණු කාරණා තහවුරු කර ගැනීම සඳහා කමිටුවක් පත්කිරීම සුදුසු බවත්,ඒ අනුව සාමාජිකයින් ලෙස

01. ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා (සභාපති)
02. ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා
03. එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
04. එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා
05. ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
06. එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
07. එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා

පත්කළ අතර අදාළ නිවාස ක්‍රමය හා ලබු කොටුව වත්ත නිවාස ක්‍රමය සම්බන්ධව නිවාස සංවර්ධන අධිකාරියෙහි වගකිවයුතු නිලධාරීන් සභාවට කැඳවා සාකච්ඡා කිරීමත්, පිඹුරුපත් 05 ක් ඉදිරිපත් කර ඇති බැවින් භූමිය හා නීත්‍යානුකූල ආයිතියත් හඳුනා ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව ගැටලුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

කරුණු කාරණා තහවුරු කර ගැනීම සඳහා කමිටුවක් පත්කිරීමට තීරණය විය.

v. 2025.11.24 දින සිට 2025.12.22 දින දක්වා රඹුක්කන ප්‍රාදේශීය සභාවේ වියදම් පිළිබඳ වාර්තාව මහ සභාව අනුමැතියට ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි.ජී.ජයවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

| දිනය | වවුචර් අංකය | නම | විස්තරය | වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| 2025.11.24 | 1298 | ශ්‍රී ලංකා ටෙලිකොම් plc | 2025.10.01 සිට2025.10.31 දක්වා ප්‍රාදේශීය සභා කාර්යාල සහ ඉඹුල්ගස්දෙනිය පුස්තකාල දුරකථන බිල්පත් ගෙවීම | 16,851.03 |
| | 1299 | ලංකා විදුලි බල මණ්ඩලය | 2025 ඔක්තෝම්බර් සහ නොවැම්බර් මාස වල විදුලි බිල්පත් ගෙවීම | 10,149.79 |
| | 1300 | ලංකා විදුලි බල මණ්ඩලය | 2025.10.01 සිට 2025.11.01 දක්වා තොග විදුලි බිල්පත් ගෙවිම | 67,923.53 |
| | 1301 | ගුණවර්ධන සෙරමික් | sisten set එකක් මිළදි ගැනීම වෙනුවෙන් ගෙවීම | 2,500.00 |
| | 1302 | එම්.එම්.ඒ. රංජිත් සෙරමික් | ළමා උද්‍යානයේ උපකරණ සවි කිරිම වෙනුවෙන් ගෙවීම | 5,930.00 |
| | 1303 | එස්.එම්.කේ.ආර්. සමරකෝන් | හාඩ්වෙයාර් උපකරණ සැපයිම වෙනුවෙන් ගෙවීම | 2,510.00 |
| | 1304 | එස්.එම්.කේ.ආර්. සමරකෝන් | හාඩ්වෙයාර් උපකරණ සැපයිම වෙනුවෙන් ගෙවීම | 15,900.00 |
| | 1305 | එස්.එම්.කේ.ආර්. සමරකෝන් | දැව ආරක්ෂණ තීන්ත සැපයිම වෙනුවෙන් ගෙවීම | 1,800.00 |
| | 1306 | ඒ.කේ.ඩබ්. පුෂ්පකුමාර | අදාහනාගාරය සඳහා ,ලාෆ් ගෑස් 37.5 Kg සිලින්ඩර 06 සැපයිම වෙනුවෙන් ගෙවීම | 99,395.00 |
| | 1307 | පේපර් ලයින් ඩේ්‍රඩින් ප්‍රයිවට් ලිමිඩට් | ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවිම | 24,455.50 |
| | 1308 | නිව් ජෙනරල් ට්‍රේඩින් | ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවිම | 33,810.00 |
| | 1309 | මෙට්‍රොපොලිටන් ටෙක්නොලොජිස් ප්‍රයිවට් ලිමිටඩ් | ටෝනර් 07 සහ ඉන්ක් බෝතල් 05 සැපයීම වෙනුවෙන් ගෙවිම | 212,400.00 |
| | 1310 | මෙට්‍රොපොලිටන් ටෙක්නොලොජිස් ප්‍රයිවට් ලිමිටඩ් | ටෝනර් 05 සැපයීම වෙනුවෙන් ගෙවිම | 106,200.00 |
| | 1311 | සූරමායා සෙරමික් | ළමා උද්‍යානය අලුත් වැඩියාව කටයුතු සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සැපයිම වෙනුවෙන් ගෙවිම | 9,990.00 |
| | 1312 | සූරමායා සෙරමික් | හාඩ්වෙයාර් උපකරණ සැපයිම වෙනුවෙන් ගෙවීම | 11,020.00 |
| | 1313 | සූරමායා සෙරමික් | හාඩ්වෙයාර් උපකරණ සැපයිම වෙනුවෙන් ගෙවීම | 14,550.00 |
| | 1314 | සිතාරා ප්‍රින්ටර්ස් | නිල මුද්‍රාවක් සකස් කිරිම වෙනුවෙන් ගෙවීම | 300.00 |
| | 1315 | සිතාරා ප්‍රින්ටර්ස් | මුද්‍රණ කටයුතු සිදු කර සැපයීම වෙනුවෙන් ගෙවීම | 500.00 |
| | 1316 | විජයසිරි ඉංජිනියරින්ස් වර්ක්ස් | ගලි බවුසයේ ආයුධ පෙට්ටිය පැස්සීම වෙනුවෙන් ගෙවිම | 2,000.00 |
| | 1317 | සභාපති, ප්‍රාදේශිය සභාව ,රඹුක්කන | සැලසුම් කමිටු දීමනාව ගෙවිම | 18,000.00 |
| 2025.11.26 | 1318 | රංජනි බේක් හවුස් | ඩෙංගු හා බෝ නොවන රෝග වැඩසටහන සඳහා සංග්‍රහ වියදම් ගෙවිම | 20,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 1319 | රංජනි බේක් හවුස් | මහ සභාව සඳහා සංග්‍රහ වියදම් ගෙවීම | 23,960.00 |
| | 1320 | ලේඛා ස්ටේෂනරීස් | රඹුක්කන මහජන පුස්තකාලය -ඔක්තෝම්බර් මස පුවත්පත් සඟරා බිල් ගෙවීම | 17,840.00 |
| | 1321 | ලේඛා ස්ටේෂනරීස් | ඉඹුල්ගස්දෙනිය පුස්තකාලය -ඔක්තෝම්බර් මස පුවත්පත් සඟරා බිල් ගෙවීම | 15,400.00 |
| | 1322 | ලේඛා ස්ටේෂනරීස් | රඹුක්කන මහජන පුස්තකාලය -සැප්තැම්බර් මස පුවත්පත් සඟරා බිල් ගෙවීම | 17,490.00 |
| | 1323 | පි.ජී.එල්.සී. කුමාර | PF 7429 කැබ් රථයේ ටයර් මාරු කිරීම වෙනුවෙන් ගෙවීම | 800.00 |
| | 1324 | පි.ජී.එල්.සී. කුමාර | Rx 2006 ටේලරයේ වම් පස රෝදයේ පැච් දැමීම වෙනුවෙන් ගෙවීම | 600.00 |
| | 1325 | පි.ජී.එල්.සී. කුමාර | Rx 1980 ගලි බවුසර අලුත් වැඩියාවක් සිදු කිරිම වෙනුවෙන් ගෙවීම | 5,450.00 |
| | 1326 | වන් වේ ටයර් සෙන්ටර් ඇන්ඩ් වීල් එලයිමන්ට් | Rx 1980 ගලි බවුසර අලුත් වැඩියාවක් සිදු කිරිම වෙනුවෙන් ගෙවීම | 5,050.00 |
| | 1327 | සභාපති, ප්‍රාදේශිය සභාව ,රඹුක්කන | ට්‍රැක්ටර් රථ 04 සහ ටේලර් රථ 04 සඳහා ආදායම් බලපත්‍ර ලබා ගැනිමට ගත් අත්තිකාරම් මුදල් පියවීම | 13,200.00 |
| | 1328 | ඊ නාලක දමිත් කුමාර | ක්‍රීඩාංගනය වෙන් කිරිම සඳහා ගෙවන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 794.63 |
| | 1329 | ඩී.එම්.ඩබ්.ඩී.බී. දිසානායක | ක්‍රීඩාංගනය වෙන් කිරිම සඳහා ගෙවන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 7,815.07 |
| | 1330 | එන්.බී.එස්. සඳරුවන් රත්නායක | ක්‍රීඩාංගනය වෙන් කිරිම සඳහා ගෙවන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 794.63 |
| 2025.12.02 | 1331 | සභාපති,ප්‍රාදේශිය සභාව,රඹුක්කන | 2025 නොවැම්බර් මස මන්ත්‍රී සභික දිමනා ගෙවීම | 540,000.00 |
| | 1332 | එම්.එල්.ජයවර්ධන | ගලි බවුසරය වෙන් කිරිම සඳහා ගෙවන ලද මුදල් ආපසු ගෙවිම | 7,875.00 |
| | 1333 | රෙජිස්ට්‍රාර් ජනරාල් | මුද්දර උප ලේඛන සකස් කිරිම සඳහා සේවා ගාස්තු ගෙවිම | 1,200.00 |
| | 1334 | රෙජිස්ට්‍රාර් ජනරාල් | මුද්දර උප ලේඛන සකස් කිරිම සඳහා සේවා ගාස්තු ගෙවිම | 1,000.00 |
| | 1335 | රෙජිස්ට්‍රාර් ජනරාල් | මුද්දර උප ලේඛන සකස් කිරිම සඳහා සේවා ගාස්තු ගෙවිම | 2,300.00 |
| | 1336 | රෙජිස්ට්‍රාර් ජනරාල් | මුද්දර උප ලේඛන සකස් කිරිම සඳහා සේවා ගාස්තු ගෙවිම | 109,900.00 |
| | 1337 | පළාත් පාලන කොමසාරිස් | කෑගල්ල අධිකරණයට අදාල උසාවි දඩ මුදල් වලට 1% දිරි දිමනා ගෙවීම | 8,862.50 |
| | 1338 | පළාත් පාලන කොමසාරිස් | මාවනැල්ල අධිකරණය අදාල උසාවි දඩ මුදල් වලට 1% දිරි දිමනා ගෙවීම | 11,193.75 |
| | 1339 | ලේඛා ස්ටේෂනරිස් | ඉඹුල්ගස්දෙනිය පුස්තකාලය -සැප්තැම්බර් මස පුවත්පත් සඟරා බිල් ගෙවීම | 15,100.00 |
| | 1340 | එච්.එම්.පි. කුමාරිහාමි | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| 2025.12.03 | 1341 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් | RC-1413 ට්‍රැක්ටරය සහ RW 2126 ගලි බවුසර් ටේලරය රක්ෂණාවරනය සිදු කිරීම | 43,687.71 |

| | | | | |
|---|---|---|---|---|
| | 1342 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් | RB-4783 ට්‍රැක්ටරය රක්ෂණාවරනය සිදු කිරිම | 8,245.42 |
| | 1343 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් | RC-1523 ට්‍රැක්ටරය රක්ෂණාවරනය සිදු කිරිම | 16,654.39 |
| 2025.12.05 | 1344 | Kegalle Distributors (pvt) Ltd | අදාහනාගාරය සඳහා ,ලාෆ් ගෑස් 37.5 Kg සිලින්ඩර 06 සැපයිම වෙනුවෙන් ගෙවීම | 99,395.00 |
| | 1345 | වි.එන්.ආර්.ප්‍රේමසිරි | අතිකාල දිමනා ගෙවිම | 8,157.40 |
| | 1346 | වි.එන්.ආර්.ප්‍රේමසිරි | අතිකාල දිමනා ගෙවිම | 5,057.59 |
| | 1347 | එච්.ආර්.අයි.පී.කේ.ජී. මැණිකේ | ගමන් වියදම් ඉල්ලීම | 854.00 |
| | 1348 | ආර්.එම්.එස්.ඒ.රත්නායක | ගමන් වියදම් ඉල්ලීම | 3,834.37 |
| | 1349 | එච්.ආර් .වරුණි ප්‍රියංගා | ගමන් වියදම් ඉල්ලීම | 854.00 |
| | 1350 | සභාපති,ප්‍රාදේශිය සභාව,රඹුක්කන | ගලි බවුසර් සේවාවේ යෙදිම වෙනුවෙන් රියදුරුට සහ සහයකට දිරි දිමනා ගෙවීම | 16,200.00 |
| 2025.12.08 | 1351 | ඩි.පී.එල්. ඩබ්. විමලරත්න | නීතිඥ නඩු ගාස්තු ගෙවීම | 9,000.00 |
| | 1352 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය | 2025 ඔක්තෝම්බර් මාසයට අදාල ඉන්ධන බිල්පත් ගෙවිම | 649,306.50 |
| | 1353 | ලංකා විදුලි බල මණ්ඩලය | 2025 ඔක්තෝම්බර් ,නොවැම්බර් මාස වලට අදාළ විදුලි බිල්පත් ගෙවිම | 35,611.68 |
| | 1354 | ජාතික ජල සම්පාදන හා ජලා පවාහන මණ්ඩලය | 2025 ඔක්තෝම්බර් ,නොවැම්බර් මාස වලට අදාළ ඉඹුල්ගස්දෙනිය පුස්තකාල ජල බිල්පත ගෙවීම | 1,758.20 |
| | 1355 | ජාතික ජල සම්පාදන හා ජලා පවාහන මණ්ඩලය | 2026 ඔක්තෝම්බර් ,නොවැම්බර් මාස වලට අදාළ ජල බිල්පත් ගෙවීම | 111,626.97 |
| | 1356 | S.D.S.කන්ස්ට්‍රක්ෂන් | බණ්ඩාරනායක ශ්‍රවණාගාර සංකීර්ණය ඉදි කිරිම කර්මාන්තයේ හතරවන බිල්පත ගෙවීම | 29,296,696.82 |
| 2025.12.09 | 1357 | එස්.ඩබ්.එස්.ශ්‍රියානන්ද | අතිකාල දිමනා ගෙවිම | 3,925.93 |
| | 1358 | වි.ඒ.එස්. ප්‍රේමසිරි | අතිකාල දිමනා ගෙවිම | 5,983.52 |
| | 1359 | එස්.එන්.නන්ද ශ්‍රී | අතිකාල දිමනා ගෙවිම | 3,938.52 |
| | 1360 | එච්.ඩබ්.ඒ.අයි.එල්.විරකෝන් | අතිකාල දිමනා ගෙවිම | 7,574.07 |
| | 1361 | ජේ.එන්.එල්. ජයසිංහ | අතිකාල දිමනා ගෙවිම | 6,210.74 |
| | 1362 | එස්.ඩබ්.පි. ධර්මසේන | අතිකාල දිමනා ගෙවිම | 7,830.93 |
| | 1363 | පී.ගීත් ප්‍රේමශ්‍රී | අතිකාල දිමනා ගෙවිම | 7,499.07 |
| | 1364 | ජී.ඒ. බන්දුසේන | අතිකාල දිමනා ගෙවිම | 8,331.48 |
| | 1365 | ජී.ජී. බී.ඒ. කුමාර් | අතිකාල දිමනා ගෙවිම | 7,278.26 |
| | 1366 | එස්.ඩබ්.සී.එස්. නන්දන | අතිකාල දිමනා ගෙවිම | 8,209.58 |
| | 1367 | ඩී.ඩබ්.ජී.ඒ. සඳරුවන් | අතිකාල දිමනා ගෙවිම | 4,666.67 |
| | 1368 | ඩබ්.ඩී.එස්.කේ.. පියතිලක | අතිකාල දිමනා ගෙවිම | 6,298.00 |
| | 1369 | එස්.එෆ්.සී.ඩබ්. පියසේන | අතිකාල දිමනා ගෙවිම | 18,187.81 |
| | 1370 | ඩබ්.ඩබ්.ඩී. වීරක්කොඩි | අතිකාල දිමනා ගෙවිම | 16,854.00 |
| | 1371 | එස්.සී.කේ. හෙට්ටිගොඩ | අතිකාල දිමනා ගෙවිම | 16,867.24 |
| | 1372 | එස්.ජේ.එස්. සමරසිංහ | අතිකාල දිමනා ගෙවිම | 21,543.33 |
| | 1373 | තරිඳු මෝටර්ස් | RW-9992 ට්‍රැක්ටර් ටේලරය අලුත්වැඩියා කීරිම වෙනුවෙන් ගෙවීම | 4,350.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 1374 | තරිඳු මෝටර්ස් | Re -2261 ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම | 208,475.00 |
| | 1375 | තරිඳු මෝටර්ස් | ZA-0191 JCB යන්ත්‍රය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම | 39,975.00 |
| | 1376 | තරිඳු මෝටර්ස් | RX - 1980 ටේලරය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම | 23,950.00 |
| | 1377 | derectot General Of pention | පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක බිල්පත ගෙවීම | 30,163.77 |
| | 1378 | පෝස්ට් මාස්ටර් ජනරාල් | තැපැල් මුද්දර වටිනාකම අලුත් කිරීම වෙනුවෙන් ගෙවීම | 30,000.00 |
| | 1379 | ශිලා ප්‍රින්ටර්ස් | මුද්‍රණ කටයුතු සිදු කර සැපයීම වෙනුවෙන් ගෙවීම | 19,850.00 |
| | 1380 | සභාපති,ප්‍රාදේශිය සභාව,රඹුක්කන | 2025 නොවැම්බර් මස අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘතියට අදාල කම්කරු වැටුප් ගෙවීම | 72,450.00 |
| | 1381 | කේ.ඒ.එස්.ඩී.කලුආරච්චි | කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවූ කාර්මික නිලධාරි කේ.ඒ.එස්.ඩී.කලුආරච්චි මහතාගේ ඔක්තෝම්බර් මස දීමනා ගෙවීම | 63,300.00 |
| | 1382 | රෝහණ එන්ටප්‍රයිසස් (ප්‍රද් සමාගම) | වාහන සඳහා ලබා ගත් ටයර් වෙනුවෙන් ගෙවීම | 461,975.00 |
| 2025.12.10 | 1383 | ඩබ්.ජී.එල්.සුබසිංහ | අතිකාල දීමනා ගෙවීම | 1,722.87 |
| | 1384 | බී.ඒ. අසංක හංස කුමාර | අතිකාල දීමනා ගෙවීම | 6,064.00 |
| | 1385 | ජී.ආර්.වයි. සමන් කුමාරි | අතිකාල දීමනා ගෙවීම | 2,621.75 |
| | 1386 | කේ.ඒ.එස්.ඩී.කළුආරච්චි | නිවාඩු දින සේවය කිරීමට අදාළ වැටුප් ගෙවීම | 7,732.00 |
| | 1387 | බී.ඒ. අසංක හංස කුමාර | ගමන් වියදම් ගෙවීම | 1,750.00 |
| | 1388 | බී.ඒ. අසංක හංස කුමාර | ගමන් වියදම් ගෙවීම | 1,018.50 |
| | 1389 | පී.ඩී.ඩබ්. චන්ද්‍රිකා කුමාරිහාමි | ගමන් වියදම් ගෙවීම | 488.88 |
| | 1390 | එස්.ජේ.එස්.සමරසිංහ | ගමන් වියදම් ගෙවීම | 4,000.00 |
| | 1391 | එච්.ඒ.අර්.එම්.කේ. හෙට්ටිආරච්චි | ගමන් වියදම් ගෙවීම | 2,208.00 |
| | 1392 | එච්.ඒ.අර්.එම්.කේ. හෙට්ටිආරච්චි | ගමන් වියදම් ගෙවීම | 535.44 |
| | 1393 | ජී.ජී. උපාලි රෝහණ | ගමන් වියදම් ගෙවීම | 700.00 |
| | 1394 | සුරංජනී සෝමදාස | ගමන් වියදම් ගෙවීම | 700.00 |
| 2025.12.11 | 1395 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් | 37-8242 ට්‍රැක්ටරයේ ඉදිරි වර්ෂය සඳහා රක්ෂණාවරණය සඳහා ගෙවීම | 9,515.40 |
| | 1396 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් | RD - 5925 ට්‍රැක්ටරය සහ RW 9992 ටේලරය ඉදිරි වර්ෂයට රක්ෂණාවරණය සඳහා ගෙවීම | 24,691.16 |
| | 1397 | භාෂිත ග්‍රැෆික් | සාහිත්‍ය උත්සවය ආරාධනා පත්‍ර මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම | 630.00 |
| | 1398 | ඩබ්. ජී.එස්. ආර්. බණ්ඩාර | ත්‍රී රෝද රථය පූර්ණ වාර සේවාව සිදු කිරීම වෙනුවෙන් ගෙවීම | 11,465.00 |
| | 1399 | නාමල් සර්විස් සෙන්ටර් | RD - 4337 ට්‍රැක්ටර් රථයේ සහ ටේලරයේ පූර්ණ වාර සේවාව සිදු කිරීම | 41,025.00 |
| | 1400 | එස්.එම්.කේ.බී. සමරකෝන් | බිත්ති ඔරලෝස් 02 මිළදී ගැනිම වෙනුවෙන් ගෙවීම | 6,000.00 |
| | 1401 | එස්.එම්.කේ.බී. සමරකෝන් | හාඩ්වෙයාර් උපකරණ මිළදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 13,875.00 |
| | 1402 | සිතාරා ප්‍රින්ටස් | මුද්‍රණ කටයුතු සිදු කර සැපයීම වෙනුවෙන් ගෙවීම | 8,125.00 |

| | | | | |
|---|---|---|---|---|
| | 1403 | Kegalle Distributors (pvt) Ltd | අදාහනාගාරය සඳහා ලිට්රෝ ගෑස් 37.5 Kg සිලින්ඩර 06 සැපයිම වෙනුවෙන් ගෙවීම | 99,395.00 |
| | 1404 | භාෂිත ග්‍රැෆික් | මුද්‍රණ කටයුතු සිදු කර සැපයීම වෙනුවෙන් ගෙවීම | 1,230.00 |
| | 1405 | භාෂිත ග්‍රැෆික් | මුද්‍රණ කටයුතු සිදු කර සැපයීම වෙනුවෙන් ගෙවීම | 8,646.00 |
| | 1406 | භාෂිත ග්‍රැෆික් | මුද්‍රණ කටයුතු සිදු කර සැපයීම වෙනුවෙන් ගෙවීම | 6,480.00 |
| | 1407 | සර් ඇන්තනීස් ඩිස්ට්‍රිබියුටස් ප්‍රයිවට් ලිමිටඩ් | හාඩ්වෙයාර් උපකරණ සැපයිම වෙනුවෙන් ගෙවීම | 69,775.00 |
| | 1408 | සර් ඇන්තනීස් ඩිස්ට්‍රිබියුටස් ප්‍රයිවට් ලිමිටඩ් | හාඩ්වෙයාර් උපකරණ සැපයිම වෙනුවෙන් ගෙවීම | 42,161.00 |
| | 1409 | සෙන්ටර් ස්ටේෂනරීස් | ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවිම | 900.00 |
| | 1410 | සෙන්ටර් ස්ටේෂනරීස් | ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවිම | 20,922.50 |
| | 1411 | එම්.ජී.එස්.එල්.ගමගේ | සාහිත්‍ය උත්සවය සැරසිලි කටයුතු සිදු කිරිම වෙනුවෙන් ගෙවීම | 10,000.00 |
| | 1412 | පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලය | පුස්තකාලය සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය සපයා ගැනීම වෙනුවෙන් ගෙවීම | 39,000.00 |
| | 1413 | Eclat musicals | පෙර පාසල් වෙත තූර්ය වාදන උපකරණ සැපයිම වෙනුවෙන් ගෙවීම | 3,100.00 |
| | 1414 | Narah Computer Forms | මුද්‍රණ කටයුතු සිදු කර සැපයීම වෙනුවෙන් ගෙවීම | 31,255.00 |
| | 1415 | පේපර් ලයින් ට්‍රේඩින් (ප්‍රයිවට් ලිමිටඩ්) | ලිපි ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවිම | 67,612.60 |
| | 1416 | The Associated News Paper of ceulon Limited | පුවත්පත් දැන්වීම් පල කිරිම වෙනුවෙන් මුදල් ගෙවීම | 113,964.40 |
| | 1417 | රංජනී බේක් හවුස් | මහ සභාව සඳහා සංග්‍රහ වියදම් දැරීම | 4,435.00 |
| | 1418 | රංජනී බේක් හවුස් | විගණන නිලධාරින් ට සහ ප්‍රසම්පාදන කමිටුවට සඳහා සංග්‍රහ වියදම් ගෙවිම | 2,000.00 |
| | 1419 | රංජනී බේක් හවුස් | සාහිත්‍ය උත්සවය සඳහා සංග්‍රහ වියදම් ගෙවිම | 24,439.00 |
| | 1420 | Jone Keells Automation (pvt) Ltd | PC 054402 ෆොටෝකොපි යන්ත්‍රය නඩත්තු කටයුතු සඳහා ගිවිසුම් ගත වීමට අදාල මුදල් ගෙවිම | 20,090.68 |
| | 1421 | සභාපති,ප්‍රාදේශිය සභාව,රඹුක්කන | ගලි තැන්පතු ආදායමට ගැනිම | 527,800.00 |
| | 1422 | සභාපති,ප්‍රාදේශිය සභාව,රඹුක්කන | සැලසුම් කමිටු දිමනා ගෙවීම | 18,000.00 |
| | 1423 | සභාපති,ප්‍රාදේශිය සභාව,රඹුක්කන | ඒ.ඩබ්. ජයරත්න - මුදල් කවුන්ටරයේ ප්‍රධාන දොරට නව යතුරක් දැමිම සඳහා අතින් වියදම් කළ මුදල් ගෙවිම | 500.00 |
| | 1424 | සභාපති,ප්‍රාදේශිය සභාව,රඹුක්කන | එම්.ජේ.එල්.මාලනි - සාහිත්‍ය උත්සවය සඳහා අතින් වියදම් වූ මුදල් ගෙවීම | 1,740.00 |
| | 1425 | සභාපති,ප්‍රාදේශිය සභාව,රඹුක්කන | එම්.ජේ.එල්.මාලනි - සාහිත්‍ය උත්සවය සඳහා අතින් වියදම් වූ මුදල් ගෙවීම | 800.00 |
| | 1426 | ආර්.එම්.ඒ. බණ්ඩාර | ගලි බවුසරය වෙන් කිරිම සඳහා ගෙවන ලද මුදල් ආපසු ගෙවිම | 7,875.00 |
| | 1427 | කේ.ඩී.ඒ.එන්.රණසිංහ | ගලි බවුසරය වෙන් කිරිම සඳහා ගෙවන ලද මුදල් ආපසු ගෙවිම | 9,215.00 |
| | 1428 | එම්.ආර්.රිස්නි | ක්‍රීඩාංගනය වෙන් කිරිම සඳහා ගෙවන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 848.62 |

| | | | | |
|---|---|---|---|---|
| | 1429 | එච්.එම්. අකිල චතුරංග | ක්‍රීඩාංගනය වෙන් කිරීම සඳහා ගෙවන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 848.62 |
| 2025.12.15 | 1430 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය | ඉඹුල්ගස්දෙනිය පුස්තකාලයේ පඩිපෙළ ආවරණය සඳහා බිත්ති කොටස් බැදීම-10% රැදවුම් මුදල් ගෙවීම | 8,117.60 |
| | 1431 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය | ප්‍රාදේශීය සභා සංකීර්ණයේ වම්පස ගොඩනැඟිල්ලේ ඇතුලත කින්ත ආලේප කිරීම - 10% රැදවුම් මුදල් ගෙවීම | 25,952.22 |
| | 1432 | නවෝදය ග්‍රාම සංවර්ධන සමිතිය | රක්තහේන පන්සල මාර්ගය සංවර්ධනය කිරීම - 10% රැදවුම් මුදල් ගෙවීම | 7,756.33 |
| | 1433 | තිළිණි නිරෝෂණි | ඉඩම් නඩු සඳහා ඔප්පු පිටපත් හා පත්තිරු ලබා ගැනිම සඳහා අතින් වියදම් වු මුදල් ලබා ගැනිම | 2,908.00 |
| | 1434 | සභාපති,ප්‍රාදේශිය සභාව,රඹුක්කන | ගලි රථ දිරි දීමනා ගෙවීම | 19,300.00 |
| | 1435 | සභාපති,ප්‍රාදේශිය සභාව, රඹුක්කන | පරිසර බලපත්‍ර අධීක්ෂණ කටයුතු දීමනා ගෙවීම | 750.00 |
| | 1436 | සභාපති,ප්‍රාදේශිය සභාව,රඹුක්කන | පරිසර කමිටු දීමනා ගෙවීම | 21,000.00 |
| 2025.12.17 | 1437 | කේ.ඒ.එස්.ඩී. කළුආරච්චි | ගමන් වියදම් ගෙවීම | 654.00 |
| | 1438 | පි.ඩී.ඩබ්.චන්ද්‍රිකා කුමාරිහාමි | ගමන් වියදම් ගෙවීම | 4,850.00 |
| | 1439 | පි.ඩී.ඩබ්.චන්ද්‍රිකා කුමාරිහාමි | ගමන් වියදම් ගෙවීම | 4,410.00 |
| | 1440 | එල්.ආර්.ඒ.ඩී. කුමාරිහාමි | ගමන් වියදම් ගෙවීම | 4,500.00 |
| | 1441 | එල්.ආර්.ඒ.ඩී. කුමාරිහාමි | ගමන් වියදම් ගෙවීම | 4,850.00 |
| | 1442 | තිළිණි නිරෝෂණි | ගමන් වියදම් ගෙවීම | 4,500.00 |
| | 1443 | තිළිණි නිරෝෂණි | ගමන් වියදම් ගෙවීම | 4,850.00 |
| | 1444 | එම්.එන්.පත්මසිරි | ගමන් වියදම් ගෙවීම | 7,407.00 |
| | 1445 | එන්.ජී. අජිත් ප්‍රියන්ත | ගමන් වියදම් ගෙවීම | 7,416.00 |
| | 1446 | එම්.ජී.ඒ.කේ. මැදවත්ත | අතිකාල දීමනා ගෙවීම | 11,985.00 |
| | 1447 | ඩී.පී.ජී. ආරියරත්න | ගමන් වියදම් ගෙවීම | 7,341.66 |
| | 1448 | ආර්.ආර්. සාලින්ද කුමාර | ගමන් වියදම් ගෙවීම | 10,300.92 |
| | 1449 | ආර්.ආර්. සාලින්ද කුමාර | ගමන් වියදම් ගෙවීම | 11,537.00 |
| | 1450 | බි.ඒ.අසංක හංස කුමාර | අතිකාල දීමනා ගෙවීම | 8,422.22 |
| | 1451 | බී.ඒ.සිසිර | අතිකාල දීමනා ගෙවීම | 2,000.54 |
| | 1452 | ඩබ්.නලින් පුෂ්ප කුමාර | අතිකාල දීමනා ගෙවීම | 6,544.96 |
| | 1453 | ආර්.ජී.එස්. නිරෝෂන් | නිවාඩු දින සේවය කිරීමට අදාළ වැටුප් ගෙවීම | 6,856.00 |
| | 1454 | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි | 2025 සැප්තැම්බර් මස ට අදාළ නිදහස් දුම්රිය බලපත්‍ර ගාස්තු ගෙවීම | 9,600.00 |
| | 1455 | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි | රශානි සමන් කුමාරි මියගේ ත්‍රෛයි මාසික දුම්රිය වාර ප්‍රවේශ පත්‍රය සඳහා ගෙවීම | 11,100.00 |
| | 1456 | ලංකා විදුලි බල මණ්ඩලය | විදුලි බිල්පත් ගෙවීම | 64,745.65 |
| | 1457 | ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී. | කාර්යාල දුරකථන බිල්පත ගෙවීම | 9,806.48 |
| | 1458 | සී/ස විවිධ සේවා සමුපකාර සමිතිය | 2025.11.01 සිට 2025.11.15 දක්වා ඉන්ධන බිල්පත් ගෙවීම | 298,856.00 |
| | 1459 | ඩී.එම්.ඩබ්.ඩී.බී. දිසානායක | ක්‍රීඩාංගනය වෙන් කිරීම සඳහා ගෙවන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,393.43 |

| | | | | |
|---|---|---|---|---|
| 2025.12.18 | 1460 | යූනිවසල් ඔෆිස් ඔටෝමේෂන් | ඩොට් මෙට්‍රික් මුද්‍රණ යන්ත්‍රය අළුත් වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම | 27,000.00 |
| | 1461 | යූනිවසල් ඔෆිස් ඔටෝමේෂන් | මන්ත්‍රී නිල හැඳුනුම්පත් සැකසීම වෙනුවෙන් ගෙවීම | 12,395.00 |
| | 1462 | ප්‍රධාන තක්සේරුකරු | වෙළඳ සංකිර්ණ කඩ කාමර තක්සේරු කිරීම් ගාස්තු ගෙවීම | 76,230.00 |
| | 1463 | ඩබ්.තිළිණි විදේශිකා | කෙසෙල්කන් වෙළඳපල ලංසු ඇප ආපසු ගෙවීම | 8,500.00 |
| | 1464 | එස්.ආර්.එල්.එස්.පි. රාජකරුණා | රඹුක්කන පොදු වැසිකිලිය ලංසු ඇප මුදල් ආපසු ගෙවීම | 8,500.00 |
| | 1465 | කේ.ජී.ආනන්ද බණ්ඩාර | ආදාහනාගාරය සඳහා ගෙවන ලද මුදල් ආපසු ගෙවීම | 15,000.00 |
| | 1466 | රංජනී බේක් හවුස් | ප්‍රසම්පාදන කමිටුව සඳහා සංග්‍රහ වියදම් ගෙවීම | 952.00 |
| | 1467 | කේ.ඒ.ඩී. කළුආරච්චි | ක්‍රීඩාංගනය වෙන් කිරීම සඳහා ගෙවන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 3,244.23 |
| | 1468 | එච්.ඒ.සි. ඒ. පියතිස්ස | ගලිරථ බැහැර කිරිම වෙනුවෙන් ඉඩමට ගෙවීම | 192,000.00 |
| | 1469 | එන් ලක්ෂ්මන් වීරසේන | රෙකෝඩරය අළුත් වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම | 1,200.00 |
| 2025.12.22 | 1470 | මහනුවර ට්‍රේඩර්ස් | ග්ලවුස් සැපයීම වෙනුවෙන් ගෙවීම | 21,210.00 |
| | 1471 | ද ඇසෝසියේටඩ් නිවුස් ජේපර් ඔෆ් සිලෝන් ලිමිටඩ් | 2026 - සැපයුම්කරුවන් ලියාපදිංචිය සඳහා පුවත්පත් දැන්වීම් පල කිරීමේ ගාස්තු ගෙවීම | 172,019.00 |
| | 1472 | Kegalle Distributors (pvt) Ltd | ආදාහනාගාරය සඳහා 37.5 kgලිට්රෝ ගෑස් සිලින්ඩර 06 සැපයීම වෙනුවෙන් ගෙවීම | 99,395.00 |
| | 1473 | යූනිවසල් ඔෆිස් ඔටෝමේෂන් | මුද්‍රණ කටයුතු සිදු කර සැපයීම වෙනුවෙන් ගෙවීම | 450.00 |
| | 1474 | කලර් ට්‍රොප් සොලියුෂන් | 2090 රිබන් 02 සැපයිම වෙනුවෙන් ගෙවීම | 5,700.00 |
| | 1475 | එස්.එම්.කේ.බී. සමරකෝන් | ට්වයින් නූල් සැපයීම වෙනුවෙන් ගෙවීම | 3,000.00 |
| | 1476 | වි.ආර්.ඊ.එන්. විරබණ්ඩාර | මන්ත්‍රී සභික දීමනාව ගෙවීම | 15,000.00 |
| | 1477 | සභාපති,ප්‍රාදේශීය සභාව,රඹුක්කන | 2025 දෙසැම්බර් මස ස්ථිර සේවක වැටුප් ගෙවීම | 7,724,043.54 |

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව ගැටලුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න පවසන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

2025.11.24 දින සිට 2025.12.22 දින දක්වා උපලේඛන අංක 01 හි සඳහන් වියදම් දැරීම සුදුසු බව තීරණය විය.

**(ඊ).02.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.කේ.කුමාර මැතිතුමා**

i. හේවාදිවෙල මහගම කොහුවිල මාර්ගය අලුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.කේ.කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.කේ.කුමාර මැතිතුමා**

හේවාදිවෙල මහා විද්‍යාලය හා රෝමානු කතෝලික පල්ලිය දක්වා දිවෙන මාර්ගය වන බවත්, සුළු වර්ෂාවකදී වුවද මෙම මාර්ගයේ ආරම්භය යටවන බවත්,එමඟින් මහජනතාව පීඩාවට පත්වන බැවින් මෙම මාර්ගය සංවර්ධන කිරීම සුදුසු බව යෝජනා කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

හේවාදිවෙල මහගම කොහුවිල මාර්ගය සංවර්ධන කිරීමට තීරණය විය.

ii. හේවාදිවෙල සිට ගබ්බල හුලන්කඩ දක්වා වූ මාර්ගය අලුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.කේ.කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.කේ.කුමාර මැතිතුමා**

හෝවාදිවෙල කොට්ඨාශයේ පිටවෙල ප්‍රදේශයෙන් ආරම්භ වී කටුපිටිය.කුරුණෑගල මාර්ගයේ හුලන්කඩ ප්‍රදේශයෙන් අවසන් වන බවත්,මෙම මාර්ගය ඉතා අබලන් තත්ත්වයේ පවතින බැවින් සංවර්ධනය කිරීම සුදුසු බවට යෝජනා කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

හේවාදිවෙල සිට ගබ්බල හුලන්කඩ දක්වා වූ මාර්ගය සංවර්ධන කිරීමට තීරණය විය.

iii. උදන්විට දාගොන්නාව සිට වෙලමැදින් ගමන් ගන්නා මාර්ගයේ ආරම්භක ස්ථානය සඳහා පැති බැම්මක් ඉදිකිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.එස්.කේ.කුමාර මැතිතුමා විසින් යොජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.කේ.කුමාර මැතිතුමා**

මෙම මාර්ගය ආරම්භක ස්ථානයේ සිට 50 m පමණ දුරක් ගිය විට කොන්ක්‍රීට් ස්ථරය යටින් පස් තට්ටුව අඩි 07 ක් පමණ ඛාදනයට ලක්ව ඇති බැවින් එම ප්‍රදේශයේ පැතිබැම්මක් ඉදිකර ආරක්ෂාව තහවුරු කිරීම සුදුසු බැවින් මෙම යෝජනාව ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

විශේෂ අවධානයක් යොමු කළ යුතු බවත්, සංවර්ධන කටයුතු සිදුකරන තෙක් අදාළ මාර්ගය ආරම්භයේ හා එම ස්ථානයේ අවදානම් තත්ත්වය පිළිබඳ දැනුවත් කර පුවරුවක් සවි කරන ලෙසත් දන්වන ලදී.මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

උදන්විට දාගොන්නාව සිට වෙලමැදින් ගමන් ගන්නා මාර්ගය සංවර්ධන කිරීමටත්, එම ස්ථානයේ අවදානම් තත්ත්වය පිළිබඳ දැනුවත් කර පුවරුවක් සවි කිරීමට ද තීරණය විය.

iv. අලුගොල්ල එපිටගෙදර මාර්ගයේ ආදාපාන වෙළ කොටසේ මාර්ගයට පැති බැම්මක් ඉදිකිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.කේ.කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.කේ.කුමාර මැතිතුමා**

වෙළ ආසන්න ප්‍රදේශයේ මාර්ගය 20 m පමණ ප්‍රමාණයක් කොන්ක්‍රීට් ස්ථරයට යටින් පස් තට්ටුව බාදනයට ලක්ව ඇති බවත්,හිස් අවකාශයක් පවතින බැවින් පැතිබැම්මක් ඉදිකර මාර්ගය ආරක්ෂා කර ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ගම්වැසියන් හා එක්ව වැලිකොට්ට හෝ යොදා තාවකාලිකව ආරක්ෂාව සපයා ගන්නා ලෙසත්, වර්ෂා ආරම්භයේ බැවින් ප්‍රතිපාදන වෙන්කර ගැනීමෙන් අනතුරුව හැකි ඉක්මනින් සංවර්ධන කටයුතු සිදු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බවත්, සංවර්ධන කටයුතු සිදුකරන තෙක් අදාළ මාර්ගය ආරම්භයේ හා එම ස්ථානයේ අවදානම් තත්ත්වය පිළිබඳ දැනුවත් කර පුවරුවක් සවි කරන ලෙස දන්වන ලදී.මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

අලුගොල්ල එපිටගෙදර මාර්ගයේ ආදාපාන වෙළ කොටසේ මාර්ගයට පැති බැම්මක් ඉදිකිරීමටත්,එම ස්ථානයේ අවදානම් තත්ත්වය පිළිබඳ දැනුවත් කර පුවරුවක් සවි කිරීමට ද තීරණය විය.

**(ඊ).03.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

i. සූරියපුර ගමමැද මාර්ගය සංවර්ධන කිරීම (ජගත් මහතාගේ නිවස අසල මාර්ගය) සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

අධික වර්ෂාවත් සමඟම මාර්ගයේ ගමනාගමනයට ඉතා අපහසු තත්ත්වයකට පත්ව ඇති බැවින් මෙම මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට යෝජනා කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

සූරියපුර ගමමැද මාර්ගය සංවර්ධන කිරීමට තීරණය විය.

ii. කිරිවන්දෙණිය වෙළමැද මාර්ගයේ පහළගම දක්වා මාර්ගයේ පැති බැම්ම සංවර්ධන කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා විසින් යෝජනා කළ අතර

එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

කිරිවත්දෙණිය නා ගස අසල පැති බැම්ම කැඩී ඇති බැවින් එය සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා ගම්වාසීන් විසින් සිදුකළ ඉල්ලීම් ලිපියක්ද පවතින බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය**

සෑම වාර්ෂා අවස්ථාවකදීම එම ස්ථානයේ ඇල කැඩී යන බවත්,එවිට එම වෙල්යායම යට වී යන බවත්, එම නිසා එම පැති බැම්ම ඉදිකිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා**

මෙම මාර්ගය 600 m පමණ සංවර්ධනය කිරීම සඳහා නම් කර ඇති බවත්,කාර්මික නිලධාරී මහත්මීන් පැමිණ මිනුම් කටයුතු සිදුකර ඇති බවත්,නමුත් අයහපත් කාලගුණයත් සමග මෙම මාර්ගයේ තිබූ තත්ත්වයටත් වඩා දැඩි ලෙස අබලන් තත්ත්වයකට පත්ව ඇති බව තවදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ආපදා තත්ත්වය පාදක කරගෙන එම මාර්ගය සංවර්ධනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

කිරිවත්දෙණිය වෙළමැද මාර්ගයේ පහළගම දක්වා මාර්ගයේ පැති බැම්ම සමඟ මාර්ගය සංවර්ධන කිරීමට තීරණය විය.

**(ඊ).04.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා - සභාපති (කාර්මික සේවා කමිටු යෝජනා)**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

2025.12.10 දින කමිටු වාර්තාවේ යෝජනා මහසභාවට යෝජනා කරන ලදී.

i. නිවාස ඉදිකිරීම සඳහා ගල්,වැලි, ප්‍රවාහනයේදී කියුබ් එකේ ට්‍රිපර් රථයක් සඳහා අවසර දීමට යෝජනා කරමි. (2025.12.10 දින පැවති කාර්මික කමිටු යෝජනා)
ii. ව්‍යාපාරික අරමුණින් ගල්,වැලි,දැව,බොරළු ප්‍රවාහනය කරන්නේ නම් කාර්මික නිලධාරියකුගේ නිර්දේශය මත ලක්ෂ 5 දක්වා ආපසු ගෙවන තැන්පත් මුදලක් සහ රු2000.00 ක ආපසු නොගෙවන මුදලක් සභාවේ තැන්පත් කර ලදුපතක් ලබා ගැනිමට යෝජනා කරමි. ( 2025.12.10 දින පැවති කාර්මික කමිටු යෝජනා)
iii. මාර්ගයට අලාභහානියක් සිදු වූ විට තාක්ෂණික නිලධාරියකුගේ අධීක්ෂණය යටතේ දින 7 ක් ඇතුළත නැවත සකස් කිරීමෙන් පසු නැවත තාක්ෂණික නිලධාරියකු පරීක්ෂා කර බැලීමෙන් අනතුරුව රඳවාගත් මුදල ආපසු ලබාදීමට යෝජනා කරමි. ( 2025.12.10 දින පැවති කාර්මික කමිටු යෝජනා)

එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**
ඉහත යෝජනා ඉදිරිපත් කිරීමට ප්‍රධාන තම අරමුණ ලෙස සභා පාරවල් ආරක්ෂා කර කරගැනීම බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
සභා පාරවල් වලින් ප්‍රතිලාභ ලබන වෙනත් ආයතන පවතින බවත්,මෙම යෝජනාව ඉතා වටිනා බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**
සෑම සති දෙකකටම වරක් බදාදාවකම උදෑසන 9.00 ට කාර්මික කාරක සභාව පවතින බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**
මාර්ගවල බර සීමාව ක්‍රියාත්මක කළ යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**
බර වාහන ඇතුළු කිරීම තහනම්- සභාපති අණ පරිදි ලෙස පුවරුවක් සවිකිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**
ලක්ෂ 5 ට උපරිමය දැමීම කාලෝචිත නොවන බවත්, අදාළ මාර්ගය තාක්ෂණික නිලධාරින්ගේ වාර්තා අනුව සිදු වූ හානියේ මුළු මුදලම අයකර ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
දැව ප්‍රවාහනයට බලපත්‍ර ලබාදෙන විට අනිවාර්යයෙන්ම සභා අනුමැතිය ලබාගත යුතු බව ප්‍රාදේශීය ලේකම්ට ලිඛිතව දැනුම් දුන් බව ප්‍රකාශ කරන ලදී.
තවද,සභා පාරවල් ආරක්ෂා කර ගැනීමට මහජන නියෝජිතයින් වන ඔබතුමන්ලාගේ දායකත්වය ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී.

අදාළ කමිටු යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
අදාළ කමිටු වාර්තාව ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

**(ඊ).05.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී වි.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

i. රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පාසල් අසල මාර්ගය සංඥා නොමැති ස්ථානවල මාර්ග සංඥා පුවරු සවිකිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී වි.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී වි.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**
පාසල් අසල පැවැති මාර්ග සංඥා පද්ධතිය අක්‍රීය තත්ත්වයක පවතින බවත්,සභාවට එය සක්‍රිය කිරීමට ප්‍රතිපාදන වෙන් කළ නොහැකි නම් මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර එය සිදු කළ යුතු බවත්,එසේ නොහැකි නම් පුද්ගලික ආයතනයක් හරහා හෝ මෙම සංඥා පද්ධතිය සක්‍රීය කිරීම ඉතා වටිනා බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
අදහස ඉතා වටිනා බවත්,සෑම මන්ත්‍රීතුමෙක්ම /තුමියක්ම මේ ගැන අවධානය යොමු කර තම බල ප්‍රදේශයේ එවැනි අවශ්‍යතා ඇති ස්ථාන පිළිබඳව දැනුවත් කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා**

සභාවක් වශයෙන් මැදිහත් වී ප්‍රධාන වශයෙන් මාර්ග තදබදය පවතින නාගරික ස්ථානවල පමණක් නොව ගම්මට්ටමෙන්ද පාසල් හඳුනා ගැනීමට සංඥා පුවරු සවිකිරීම ඉතා වටිනා බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

ප්‍රධාන වශයෙන් පාසල් පවතින්නේ මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග වල හෝ පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට අයත් මාර්ග වල බවත්, එම නිසා එම ආයතන දැනුවත් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මීට ප්‍රථම මෙවැනි යෝජනාවක් වන කුරියම්පල දුම්රිය හරස් මාර්ගයේ අනතුරුදායක තත්ත්වය නිසා දුම්රිය දෙපාර්තමේන්තුව දැන්වත් කර නාමපුරුවක් සවිකිරීමට යෝජනාවක් න්‍යාය පත්‍රයට ඇතුළත් කළ බවත්,එය ක්‍රියාත්මක නොවීම සම්බන්ධව කණගාටුව ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගන්නා බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

සභා පාරවල් වල පිහිටි පාරවල් අසල නාමපුවරු පමණක් සභාව මැදිහත් වී සිදු කළ හැකි බවත්, දුම්රිය හරස් මාර්ග සම්බන්ධව රුක්මන් මැතිතුමාගේ එම යෝජනාව මෙම වසරේදී ක්‍රියාත්මක වන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

රුක්මන් මන්ත්‍රීතුමාගේ එම යෝජනාව දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේදී සාකච්ඡා වූ බවත්,දිස්ත්‍රික් ලේකම් කමිටුව දැනුවත් කර ඇති බවත්,ඊට අදාළ පියවර මේ වර්ෂය තුළ ගනු ඇතැයි ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

රඹුක්කන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පාසල් අසල මාර්ගවල සංඥා නොමැති ස්ථානවල මාර්ග සංඥා පුවරු සවිකිරීමට තීරණය විය.

**(ඊ).06.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

i. රඹුක්කන බල ප්‍රදේශය ආවරණය වන පරිදි සත්ව සුරැකුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

රඹුක්කන බලපදේශය ආවරණය වන පරිදි සත්ව සුරැකුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට යෝජනා කරමි යන යෝජනාව සංශෝධනයක් සහිත ඉදිරිපත් කරන බවත්, සභාවක් හැටියට ඒ සම්බන්ධව කටයුතු කළ හැකි නම් ඒ හා සම්බන්ධ ආයතන දැනුවත් කිරීමට යෝජනා කරමි.

රඹුක්කන බල ප්‍රදේශයේ පමණක් නොව මුළු රටටම බලපාන ලද ප්‍රශ්නයක් වීදී සුනඛයින් හා අනෙකුත් සතුන් දැක්විය හැකි බවත්, රිලා ප්‍රශ්නයේදී ජාතික වැඩසටහනක් ලෙස එම සතුන් අල්ලා සුරක්ෂිත ස්ථාන වලට රැගෙන යාම පෙර පැවති රජයන් විසින් සිදුකළ බවත් ප්‍රකාශ කරන ලදී.මාර්ගවල බොහෝ අවස්ථාවල සුනඛයින් හා වෙළඳුන් අනතුරට ලක්ව බොහෝ අපහසුතාවයට ලක්ව සිටින අයුරු දැක ගත හැකි බවත්, එම නිසා ඔවුන් රැකබලා ගැනීමට ස්ථානයක් සොයා බලා සුරැකුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

අරණායක ප්‍රදේශයේ ලාංකික පුරවැසියෙක් විදේශාධාර යටතේ අක්කර 04 ක භූමි ප්‍රදේශකය සුරුකුම් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යන බවත්, රඹුක්කන සිටින වීදි සුනඛයින්ද එම මධ්‍යස්ථානයේ හිමිකරු හා සාකච්ඡා කර ලබාදීමට අවැසි කටයුතු සිදුකිරීම සුදුසු බව යෝජනා කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

එන්නත් ක්‍රමවේදයක් අනුගමනය කර බල්ලන් ව්‍යාප්තිය පාලනය කළ හැකි බවත්,මිනිසුන් නඩත්තු කළ නොහැකි රටකට සතුන් නඩත්තු කිරීම සිදුකළ නොහැකි බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

අතීතයේදී බල්ලන් වෙඩි තබා මැරූ බවත්, සදාචාර සම්පන්න සමාජයක් කරා යන ගමනේ දී එවන් කටයුතු සුදුසු නැති බැවින් බල්ලන් පාලනය කිරීම සම්බන්ධ එන්නත් කිරීමේ ව්‍යාපාරයක් ක්‍රියාත්මක කිරීම සුදුසු බවත්, රිලවුන් සම්බන්ධවත් මොනයම් හෝ ක්‍රියාමාර්ගයක් ගත හැකිනම් ඉතා වටිනවා බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා**

අරණායක ප්‍රදේශයේ එම මධ්‍යස්ථානය පිළිබඳ තොරතුරු ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

කෘෂි නිලධාරීන්හට තම බල ප්‍රදේශයේ වගාහානි සිදු කරන සත්වයින් පිළිබඳව තොරතුරු ලබාදෙන ලෙසත්, ඒ සම්බන්ධව ගත යුතු ක්‍රියාමාර්ගය පිළිබඳවත් දැනුවත් බවක්,පවතින රජය මගින් ලබාදී ඇති බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා**

සුරතල් සතුන් ඇති කිරීම සම්බන්ධව නීතියක් නොමැති බවත්,ජලභීතිකාව අළුයට ගිනි මෙන් ලංකාව පුරා ව්‍යාප්ත පවතින බවත්,රජය විශාල මුදලක් මේ සම්බන්ධ වාර්ෂිකව දරණ බවත් ප්‍රකාශ කරන ලද අතර එන්නත් කරණය මගින් සුනඛයින් පාලනය කළ නොහැකි බවත්,සුනඛ වන්ද්‍යාකරණය මගින් ඉහළ ප්‍රතිඵලයක් ලබාගත හැකි බවත් පවසන ලද අතර රජය මැදිහත් වී හෝ රාජ්‍ය නොවන සංවිධාන ඒකාබද්ධ කරගෙන හෝ මෙම සුනඛ වන්ද්‍යාකරණය ප්‍රවර්ධනය කිරීම සුදුසු බවට ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

නාරම්බැද්ද ප්‍රදේශයෙත් මෙවැනි සුරුකුම් මධ්‍යස්ථානයක් පවතින බවත්,වීදි සුනඛයින් එම ස්ථානයටද ලබාදිය හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.ජී.කරුණාවතී මැතිතුමිය**

සත්ත්ව හිංසනයට අකමැති කෙනෙක් විදිහට මෙම විදී සුනඛයින් වෙනුවෙන් යම් දෙයක් සිදුකරනවා නම් ඉතා අගය කොට සලකන බව ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

බොහෝ මන්ත්‍රීතුමන්ලාට/තුමියන්ලා බලපා ඇති ප්‍රශ්නයක් බැවින් බලු කමිටුවක් පත්කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

සභාව ගර්භයේ ඝෝෂා

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

කමිටුවක් පත් කිරීම සුදුසු බව හැඟෙන බවත්,කමිටුවකට පත් වීමට කිසිවකුත් ඉදිරිපත් නොවන නිසාත්, පරිසර කමිටුව වෙත මේ සම්බන්ධව තාක්ෂණික වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දන්වන ලද අතර රෝහණ මන්ත්‍රීතුමාගේ සම්පත් දායකත්වය ලබා ගන්නා ලෙසත් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

තාක්ෂණික වාර්තාවක් ඉදිරිපත් කිරීමෙන් පසු මෙය ක්‍රියාත්මක කිරීමට තීරණය විය.

**ii.** දැලිවල යකුල්ල මාර්ගයේ වල්ලාරේ ඔය නිසා මාර්ගය ආසන්නයටම ඛාදනය වී ඇති බැවින් එම ස්ථානය සංවර්ධනය කිරීම සුදුසු බවට **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා විසින්** යෝජනා කළ අතර එම යෝජනාව **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එච්.ආර්.ප්‍රදිපා රංජනී මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

මෙම මාර්ගය නැවත නැවතත් ඛාදනයට පත් වී ඇති මාර්ගයක් බවත් දිගින් දිගටම මාර්ගය ඛාදනයට ලක්වුවහොත් මහජනතාව විශාල ගැටලුවකට මුහුණ දීමට සිදුවන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

දැලිවල යකුල්ල මාර්ගයේ වල්ලාරේ ඔය නිසා මාර්ගය ආසන්නයටම ඛාදනය වී ඇති ස්ථානය සංවර්ධනය කිරීමට තීරණය විය.

**(ඊ).07.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

**i.** උඩුගම කන්සලගමුව නියැදගල මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා විසින්** යෝජනා කළ අතර එම යෝජනාව **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.**

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

මෙම මාර්ගය භාවිත කිරීම සඳහා පවුල් 50 ක් පමණ ඇති බවත්,මෙහි මීටර් 50 m පමණ කඳුකර ප්‍රදේශයක් කොන්ක්‍රීට් කර සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

නාය යෑම් සිදුවී ඇති ප්‍රදේශයක් බැවින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් වාර්තා ලබාදෙන තෙක් යෝජනාව භාරගෙන තබා ගනිමුයි ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් වාර්තාවක් ලබා ගැනීමට තීරණය විය.

ii. කෙම්පිටිය හලාගිරියේ මාර්ගය සංවර්ධනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**
මෙම මාර්ගයේ කොන්ක්‍රීට් නොකර පවතින 50 m පමණ ප්‍රමාණයක් පවතින බවත්,එම කොටස සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලා සිටින ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මෙම යෝජනාව භාරගන්නා බවත්, මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
කෙම්පිටිය හලාගිරියේ මාර්ගය සංවර්ධනය කිරීමට තීරණය විය.

iii. උඩුගම ගොන්දෑවල වසමේ පුංචි වැලිකන්ද ජනපදයට ආසන්නයේ පුස්සමුල්ලන්ද ඉඩමේ පවත්වාගෙන යන කුකුළු ගොවිපොළ නිසි ක්‍රමවේදයකට පවත්වාගෙන යාම හෝ ඉන් ඉවත් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**
අක්කර 10 පමණ ඉඩමක කුකුළු ගොවිපළක් පත්වාගෙන යන බවත්, විශාල පරිමාණයේ ගොවිපලක් බවත්, මසකට කුකුළන් 8000 ක් පමණ මස් සඳහා ප්‍රවාහනය කරන බවත්, ගම්වැසියන්ද මහත් අපහසුතාවන්ට ලක්ව සිටින බවත්, විවිධ රෝග වලට ගොදුරු වී ඇති පුද්ගලයින් සිටින බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
සත්ව පාලනය සම්බන්ධව නියමිත ක්‍රමවේදයකට අනුව කරගෙන යෑමට අවශ්‍ය උපදෙස් ලබාදීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
යෝජනාව භාර ගත් බවත්,අදාළ ෆාම් එක පිහිටි ස්ථානය පෙන්වන ලෙසත් දන්වන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා**
ජනතා නියෝජිතයින් වශයෙන් යම් යම් පුද්ගලයින්ගේ රහස්‍ය තොරතුරු මෙසේ ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීම ඉතා අසෝබන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
උඩුගම ගොන්දෑවල වසමේ පුංචි වැලිකන්ද ජනපදයට ආසන්නයේ පුස්සමුල්ලන්ද ඉඩමේ පවත්වාගෙන යන කුකුළු ගොවිපොළ නිසි ක්‍රමවේදයකට අනුව පවත්වා ගෙන යාමට හිමිකරු දැනුවත් කිරීම තීරණය විය.

**(ඊ).08.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

i. යටිවල්දෙනිය පොදු සුසාන භූමියේ අඩි දෙකක් පස් පුරවා සකස් කර දීමට සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
සංශෝධනයකට යටත්ව ඉදිරිපත් කරන බවත්, යටිවල්දෙණිය පොදු සුසාන භූමිය මිනුම් කටයුතු කර අඩි දෙකක් පස්පුරවා සකස් කර දීම සුදුසු බවට යෝජනා කරමි.
වපසරිය පර්චස් 78 වුවත් එය මේ වන විට අඩුවී ඇති බවත්, මිනී වලවල් කැපීමේදී මීට පෙර වළලන ලද මිනී වලේහි අවශේෂ කොටස් හමුවන බැවින් ප්‍රදේශවාසීන්ගේ යෝජනාවක් බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**
නැවත පස් දමා සුසාන භූමි ගොඩකිරීම සම්බන්ධව නීතිමය පැත්ත පිළිබඳව සොයා බලා කටයුතු සිදු කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
නීතිමය වශයෙන් නැවත ගොඩනැගීමට සිදුවේ යැයි නම් කළ මෘත දේහයන් තමා දන්නා තරමින් මෙහි නොමැති බවත්, ග්‍රාමීය සමිති වලින් බලාපොරොත්තු වන්නේ වලවල් කැපීමේදී පරණ මෘත දේහයන්ගේ කොටස් මතුවන එක වළක්වා ගැනීම බවත්, වසම් හතරක දේහයන් මෙතනට ගෙන එන බවත්, 2023 වර්ෂයේ සිට මේ සම්බන්ධව ඔවුන් ඉල්ලීම් සිදු කරන බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**
යටිවල්දෙණියේ ගමේ ඉහළ ප්‍රදේශයේ සිට එන මාර්ගයේ කාණු පද්ධතිය පහළ ප්‍රදේශය වන විට සුසාන භූමි ආසන්නයේදී අවසන් වන බවත්,වර්ෂා කාලයේදී විශාල ජල ධාරිතාවක් කණුව හරහා ඇවිත් සුසාන භූමිය හරහා පහළ ගලා යන බවත් ප්‍රකාශ කරන ලදී. ඒ නිසා පස් දමා සුසාන භූමිය ගොඩකිරීමට ප්‍රථම මිනුම් කටයුතු සිදුකර පහළ පවතින හෙළ ප්‍රදේශයට බැම්මක් යෙදීම හා කාණු පද්ධතිය සකස් කිරීමටත් සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**
වසම් හතරක මෘත දේහයන් මිහිදන් කරන සුසාන භූමියක් බවත්, මායිම් ලකුණු කර වැට ගැසීම, බැම් බැඳීම හා කාණු පද්ධතිය සකස් කර ගේට්ටුවක් සවිකිරීම ඉතා වටිනා බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**
සභාපතිතුමනි, මෙම යෝජනාව අද සභාවට භාර නොගෙන ලබන වාරයට ගැනීම සුදුසු බවත්, ඒ කාලය තුළදී කරුණු කාරණා හා ආඥා පනත් අධ්‍යයනය කර නීතිමය උපදෙස් ද ලබාගෙන අදාළ තාක්ෂණික ඇගයීමක්ද සිදුකර සභාවට ඉදිරිපත් කිරීම සුදුසු බව යෝජනා කරන බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
කෙසේ හෝ මෙම සුසාන භූමිය මහජනතාවගේ අවශ්‍යතාවයන් සපුරාලන ලෙස සකස් කිරීමට අවශ්‍ය බැවින් සුදුසු තීරණයක් ගැනීම සභාව සතු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
න්‍යාය පත්‍රයට ඇතුළත් කළේ මන්ත්‍රීවරුන්ගේ අදහස් ලබාගත යුතුව තිබූ හෙයින් බවත්, අදාළ විෂය භාර නිලධාරි තුමිය මේ වන විටත් සභා දේපළ තක්සේරු කරමින් සිටින බවත්, මෙම සුසාන භූමිය සම්බන්ධව උපසභාපතිතුමන් ප්‍රකාශ කළ පරිදි නීතිමය තත්ත්වය පිළිබඳ සොයා බලා හා අණ පනත් සම්බන්ධවද පුළුල් අධ්‍යයනයක් සිදු කිරීම සුදුසු බවත්, අදාළ තාක්ෂණික ඇගයීමෙන් පසු මෙම යෝජනාව භාර ගැනීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව පසුවට සලකා බැලීමට යෝජනා විය.

තීරණය
තාක්ෂණික ඇගයීමක් සිදුකිරීමට තීරණය විය.

**ii.** රඹුක්කන මාවනැල්ල ප්‍රධාන මාර්ගයේ කඩිගමුව බෝක්කු අවදානම් තත්ත්වයේ පවතී එම නිසා දුම්රිය හරස් මාර්ගය සකස් කිරීමට ගරු ප්‍රවාහන මහා මාර්ග අමාත්‍යතුමාට මේ පිළිබඳ දන්වා යැවීමට සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
මෙම බෝක්කුව වසර 30 ත් වඩා පරණ බවත්, අධික වර්ෂාවත් සමඟය දිය උල්පත් මතු වී අවදානම් තත්ත්වයක පවතින බවත්, පැවැති අයහපත් කාළගුණයත් සමඟ උඩරට දුම්රිය මාර්ගයේ දුම්රිය ගමන් නොගන්නා බැවින් හා කලින් මිනුම් කටයුතු සිදුකර ඇති බැවින් මෙය අවස්ථාවක් කරගෙන දුම්රිය හරස් මාර්ගය සකස් කිරීමට ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යාංශය දැනුවත් කිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මෙම දුම්රිය හරස් මාර්ගය සම්බන්ධව ව්‍යසනයත් සමඟම සම්බන්ධීකරණ කමිටුව මඟින් ක්ෂණිකව කටයුතු සිදුකර ඇති බවත්, මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර ඇති බවත්, අවශ්‍ය ක්‍රියාමාර්ග හැකි ඉක්මනින් ගනු ඇතැයි ද ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
ප්‍රවාහන හා මහා මාර්ග අමාත්‍යතුමා දැනුවත් කර ඇති බවත්, සම්බන්ධීකරණ කමිටුව මඟින් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට තීරණය විය.

iii. අප බල ප්‍රදේශයේ ඇති සැලුම්වල කෙස් ලබා නොගැනීම නිසා ඔහු අපහසුතාවයට පත්ව ඇත එම නිසා ඒ සඳහා යම්කිසි වැඩපිළිවෙලක් සකස් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
මෑතක සිට සැලොන්වල පවතින කෙස් ලබා නොගන්නා බවත්, ව්‍යාපාරය කරගෙන යාමට බලපත්‍ර ලබා දී ඇති බවත්, ඉදිරියේදී විශාල පාරිසරික හානියක් සිදුවිය හැකි බවත්, මේ සම්බන්ධ අවධානය යොමු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

පරිසර කමිටුව මගිනුත් මේ සම්බන්ධව සාකච්ඡා කරමින් පවතින බවත්, වෙළඳ බලපත්‍රය ලබා දෙන විට එම කෙස් තමා ආරක්ෂිතව ගබඩා කරගත යුතු බව පැහැදිලිව සටහන් කර තිබෙන බවත් ප්‍රකාශ කරන ලදී. නමුත් මෙතෙක් එම ක්‍රමවේදය අනුගමනය කර නොමැති බවත්, ඉදිරියේදී පරිසර කමිටු වාර්තාව සභාවට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන බවත්, ඒ අනුව ඉදිරි කටයුතු කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

උප සභාපතිතුමන් පැවසූ පරිදි පරිසර කමිටු වාර්තාව අනුව ගතයුතු ක්‍රියාමාර්ග සම්බන්ධව තීරණයකට යෑම සුදුසු බවත්, අදාල යෝජනාව භාරගන්නා බවත් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාල යෝජනාව දිගුවකට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

පරිසර කමිටු වාර්තාව මත මෙම යෝජනාව නැවත සාකච්ඡාවට ගැනීමට තීරණය විය.

**(ඊ).09.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩබ්.ජී.කරුණාවති මැතිතුමිය**

i. සභාවට අයත් සූරියපුර දැනට ළදරු පාසලක් කරගෙන යන වසමේ පොදු සමිති සමාගම් පවත්වාගෙන යන පවත්වන භාවිතා කළ නොහැකි අබලන් තත්ත්වයේ ඇති ප්‍රජා සමිති ගොඩනැගිල්ල කඩා ඉවත් කර නව ගොඩනැගිල්ලක් සාදා දෙන ලෙස සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ඩබ්.ජී.කරුණාවති මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එම්.ආර්.එන්.එම්.ජයසුන්දර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ඩබ්.ජී.කරුණාවති මැතිතුමිය**

මාරුක්වතුර ග්‍රාම සේවා වසමේ ප්‍රධාන තම ප්‍රජාශාලාව මේ බවත්, වසර 25 ක් පමණ පැරණි ගොඩනැගිල්ලක් බවත්, ළදරු පාසල මෙහි පවත්වාගෙන යාම ඉතා අවදානම් බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

මෙම ගොඩනැගිල්ල ඉතා පැරණි බවත්, අබලන්තත්වයේ පවතින බවත්, ප්‍රාදේශීය ලේකම් හරහා බහු කාර්ය ගොඩනැගිල්ලක් ඊට යාබදව ඉදිකර ඇති බවත් ප්‍රකාශ කරන ලදී. තවද, මාරුක්වතුර ග්‍රාම සේවා වසමේ ප්‍රාදේශීය සභාවට අයත් දේපළ කිහිපයක් පවතින බවත්, පන්සල අසල පර්චස් 70 ක පමණ ඉඩමක් පවතින බවත්, එම දේපළ අධ්‍යයනය කර පූර්ණ ළමා විය සංවර්ධන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම ඉතා වටිනා බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය**

කාලෝචිත යෝජනාවක් බවත්, එම ගොඩනැගිල්ලේ වහලයවත් හැකිනම් පිරිසකර දෙන ලෙස ඉල්ලා සිටින ලදී. එසේම නාරම්බැද්ද වසමට ලක්ෂ 20 ක ප්‍රතිපාදන ලැබුණු බව දැනගන්නට ලැබුණු බවත්, මේ වන තෙක් කිසිදු සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වී නොමැති බවත්, අදාළ ප්‍රතිපාදන වලට කුමක් වූ වේදැයි විමසන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ගිය වසරේ වෙන් වූ ප්‍රතිපාදන හදිසි ආපදා තත්ත්වයත් සමඟ ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව ප්‍රකාශ කරන ලදී. තවද, මෙම දේපළ සභා දේපළක් නොවන බවත්, මෙම දේපළ සභා දේපළක් ද යන්න විමසන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය**

සූරියපුර දැනට පෙර පාසල කරගෙන යන ගොඩනැගිල්ල අයත් භූමිය ප්‍රාදේශීය සභාවට අයිති නොමැති බවත්, ප්‍රාදේශීය ලේකම් හරහා මෙම ගොඩනැගිල්ල සංවර්ධනය කර ගැනීමේ හැකියාව පවතින බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සභා අරමුදල් සභා දේපලට පමණක් යෙදවිය හැකි බවත්, සභා දේපළවල මෙම ගොඩනැගිල්ලෙහි තොරතුරු නොමැති බවත්, ප්‍රාදේශීය ලේකම් හරහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට පියවර ගැනීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාල යෝජනාව දිගුවකට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
ග්‍රාම නිලධාරී හරහා ප්‍රාදේශීය ලේකම් දැනුවත් කිරීම සුදුසු බව තීරණය විය.

**(ඊ).10.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා**

i. වරාගොඩ සිට අම්බුලුගල දක්වා ඇති ප්‍රාදේශීය සභා මාර්ගය ඉතා පටු වී ඇති බැවින් පාරේ පළල මැන ලකුණු කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා විසින් යෝජනා කල අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා**

අඩි 20 ක් පමණ පළල මාර්ගයක් බවත්, අදාළ තාක්ෂණික නිලධාරින් යොදවා මාර්ගය නැවත මිනුම් කටයුතු සිදුකර කාණු පද්ධතිය සකස් කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා**

ගැසට් එක අනුව එම මාර්ගය අඩි 12 ට ගැසට් වී ඇති බවත්, අඩි 8 ක් කොන්ක්‍රීට් කර පවතින බවත් ප්‍රකාශ කරන ලදී. විශේෂයෙන්ම මාර්ග ලකුණු කිරීමේ දී පුවක් කීරී හෝ වැටමාර වෙනුවට ස්ථිර කණුවක් සවිකිරීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

එම මාර්ගය නිරීක්ෂණය කළ යුතු බවත්,මාර්ග ලකුණු කිරීමට යන අවස්ථාවලදී අදාළ මාර්ගය දෙපස ඇති නිවාස දැනුවත් කිරීමේ වගකීම මහජන නියෝජිතයින් වන ඔබතුමන්ලා භාර ගන්නා ලෙසත්, තරංග මන්ත්‍රී තුමන් දැක්වූ අදහස ක්‍රියාත්මක කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාල යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
මාර්ගය දෙපස ඇති නිවාස දැනුවත් කර,මායිම් ලකුණු කර ස්ථිර කණුව සවි කිරීමට තීරණය විය.

ii. පල්පාන සිට උඩදෙනිය ගල්වල හරහා සුරූස උයන දක්වා ඇති මාර්ගය අඩි දහයකට පළල් කර සකස් කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.සී.සරත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා**
පල්පාත සිට උඩදෙනිය ගල්වල හරහා සුරුස උයන දක්වා වූ මාර්ගය පැවති අයහපත් කාලගුණයත් සමඟ නාය යෑමට ලක්ව පවතින බවත්, එම මාර්ගය වෙනුවෙන් විකල්ප මාර්ගයක් ලෙස උඩදෙනිය ප්‍රදේශයෙන් ගමන් කළ හැකි පැරණි මාර්ගයක් පවතින බවත්, එම මාර්ගයට වතු දෙකක් පමණක් මායිම් වන බවත්, ඔවුන්ගේ විරුද්දත්වයක් නොමැති බවත්, 300m ක පමණ දුරක් මාර්ගය කපා ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා**
මාවනැල්ල ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයක් බවත්, විකල්ප මාර්ගයක් ලෙස අඩි 12 කට සකස් කිරීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා**
ග්‍රාමීය මාර්ග සම්බන්ධව සම්මුතියකට පැමිණිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ විකල්ප මාර්ගය පිළිසකර කිරීමට තීරණය විය.

**(ඊ).11.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය**

i. කසල අංගනයේ සේවයේ නියුතු කම්කරුවන් සඳහා (විශේෂයෙන් කාන්තාවන්) ආහාරපාන ගැනීමට සහ සනීපාරක්ෂක කටයුතු (ඇඳුම් මාරු කර ගැනීම වැනි) කටයුතු සඳහා කාමරයක් සකසා දීමත්,
ii. ඔවුන්ට පානීය ජලය ලබාදීමට ක්‍රමවේදයක් සැකසීම (උදාහරණ ජල මාර්ගය දිගු කිරීම) සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය**
I/II යෝජනා කසලාංගනයේ සේවයේ නියුතු කම්කරු සේවක මහත්ම මහත්මීන් වෙනුවෙන් ඔවුන් මුහුණ පාන ගැටලුවක් බැවින් සභාවට ඉදිරිපත් කළ බව ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.
තීරණය -තාවකාලික කාමරයක් සකසා දීමටත්,ජල පහසුකම ලබාදීමටත් තීරණය විය.

## කල්දී නොමැති යෝජනා

### ඊ. II. 01

2026 වර්ෂය සඳහා රඹුක්කන ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලිය මහ සභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2026 වර්ෂයට අදාළව සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කළ යුතු බවත්, එය මාධ්‍යයට යොමු කළ යුතු බවත්, ඊට අදාළ නාමාවලිය සභා අනුමැති ඉදිරිපත් කර ඇති බවත් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
2026 වර්ෂය සඳහා රඹුක්කන ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලිය අනුමත කිරීම තීරණය විය.

### ඊ. II. 02

අත්‍යාවශ්‍ය මහජන ඉල්ලීම් - පොදු අරමුදල් 2025 යටතේ කොටගම හිරිවඩුන්න ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වන R.M.රත්නායක ජයවර්ධන මහතාගේ නිවස අසලින් ආරම්භවන හිටිනාවත්තපාර සංවර්ධනය කිරීම ව්‍යාපෘතියට අදාළ රු246,645.91 ක මුදල දිමුතු ග්‍රාම සංවර්ධන සමිතියට ගෙවීමට මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රු246,645.91 ක මුදල දිමුතු ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ගෙවීමට තීරණය විය.

### ඊ. II. 03

කෙහෙල්වතුගොඩ සිට මල්බෙරිවත්ත දක්වා මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ මුදල වන රු435,806.90 ක මුදලක් අඹුවන්ගල ගොවි සංවිධානය වෙත ගෙවීමට  මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -රු435,806.90 ක මුදල අඹුවන්ගල ගොවි සංවිධානය වෙත ගෙවීමට  තීරණය විය.

## ඊ. II . 04

2025 සභා අරමුදල් යටතේ සේනානායක මාවතින් ආරම්භක මොට්ටප්පුලිය වත්ත මාර්ගය ගිලා බැස ඇති ස්ථානයට පැතිබැම්මක් ඉදිකිරීමසඳහා රු1,004,424.38 ක මුදලක් නිරෝගා වැටිහිටි සමිතියට ගෙවීමට මහ සභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- ❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

රු1,004,424.38 ක මුදල නිරෝගා වැටිහිටි සමිතිය වෙත ගෙවීමට තීරණය විය.

## ඊ. II . 05

තැපැල් මුද්දර වටිනාකම අලුත් කිරීම වෙනුවෙන් රු30,000.00 ක මුදල පෝස්ට් මාස්ටර් ජනරාල් ගිණුම් අංක 027-1001-29027337 වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- ❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

රු30,000.00 ක තැපැල් මුද්දර වටිනාකම පෝස්ට් මාස්ටර් ජනරාල් ගිණුම් අංක 027-1001-29027337 වෙත ගෙවීමට තීරණය විය.

## ඊ. II. 06

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් ප්‍රතිපාදන මත 2025 වර්ෂයේදී ඉදිකළ රඹුක්කන පශු වෛද්‍ය කාර්යාලයේ රැඳවුම් බැම්ම හා වැට අලුත් වැඩියා කිරීමට අදාළ රැඳවුම් මුදල ලෙස රු. 193,185.59 ක මුදල සී/ස රඹුක්කන විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ගෙවීමට මහසභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

- ❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

රු. 193,185.59 ක රැඳවුම් මුදල සී/ස රඹුක්කන විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ගෙවීමට තීරණය විය.

## ඊ. II. 07

අත්‍යවශ්‍ය මහජන ඉල්ලීම් - පොදු අරමුදල් 2025 යටතේ ඉහළගම ප්‍රධාන මාර්ගයේ ගල්වැටිහේන වැරැල්ල දක්වා මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු. 166,186.42 මුදලක් දොඹේමඩ නැගෙනහිර ගොවි

සංවිධානයට ගෙවීමට මහසභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

රු. 166,186.42 ක මුදල දොඹේමඩ නැගෙනහිර ගොවි සංවිධානය වෙත ගෙවීමට **තීරණය විය.**

## ඊ. II. 08

අත්‍යවශ්‍ය මහජන ඉල්ලීම් පොදු - අරමුදල් 2025 යටතේ ගබ්බල උතුර වල්පොල පාර සංවර්ධනය කිරීම සඳහා රු. 347,869.28 ක මුදල ගබ්බල උතුරු කෘෂි නිෂ්පාදන ගොවි සංවිධානයට ගෙවීමට මහසභා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

රු. 347,869.28 ක මුදල ගබ්බල උතුරු කෘෂි නිෂ්පාදන ගොවි සංවිධානය වෙත ගෙවීමට **තීරණය විය.**

## ඊ. II. 09

2026 - පොදු අරමුදල් යටතේ නව වෙළඳ සංකීර්ණයේ පළමු මහලේ වැසි ජලය කාන්දුවන ස්ථාන පිලිසකර කිරීම සඳහා වන රු 255,000.00 ක ඇස්තමේන්තුව සහා අනුමැතිය ලබා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

රු 255,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරීම **තීරණය විය.**

## ඊ. II. 10

2025 දෙසැම්බර් මස සභික දීමනාව (රු.525,000.00) ගෙවීමට මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
2025 දෙසැම්බර් මස සභික දීමනාව වන රු.525,000.00 ක මුදල ගෙවීමට **තීරණය** විය.

### ඊ. II. 11

2025 දෙසැම්බර් මස ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියට අදාළ කම්කරුවන්ට දින වැටුප් ගෙවීමට මහසභා අනුමැතිය ලබා ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

| | | |
|---|---|---|
| කම්කරුවන් | 02 | |
| දින ගණන | 49 | |
| දෛනික වැටුප | 49*1500 | 73,500.00 |
| සේවක අර්ථසාධක අරමුදල් | 8820.00 | |
| සේවා නියුක්ත අරමුදල් | 2205.00 | 11,025.00 |
| **එකතුව** | | **84,525.00** |

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සම්බන්ධව ගැටළුවක් හෝ විරුද්ධත්වයක් පවතීද යන්න විමසන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
2025 දෙසැම්බර් මස ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියට අදාළ කම්කරුවන්ගේ දින වැටුප් මුළු මුදල වන රු.84,525.00 ක් ගෙවීමට **තීරණය** විය.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පද්මසිරි මන්ත්‍රීතුමන්ගේ යෝජනාවක් වන මාකඩවර මාර්ගය 2026.01.24 දින හදිසියේ කැඩීගොස් පවතින බවත්, එය භාවිතා කරන මහජනතාව මහත් අපහසුතාවයට පත්ව ඇති බවත්, ඉතා කඩිනමින් ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස ඉල්ලා සිටින බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

නාය යැමත් සමග එම ප්‍රදේශයේ කාණු පද්ධතිය අවහිර වී ඇති බවත්, කාණු පද්ධතියෙන් ගලා ආ ජලය මාර්ගය හරහා ගොස් ඇති බවත් ප්‍රකාශ කළ අතර එම ස්ථානයට පැති බැම්මක් හා බෝක්කුවක් දැමීම සුදුසු බව යෝජනා කරන බවත් ප්‍රකාශ කරන ලදී.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

හදිසි කළ යුතු කාර්යයක් බවත්, අවදානම් පුවරුවක් සවිකල යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
අවදානම් පුවරුවක් සවිකිරීමට හා හැකි ඉක්මනින් ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීමට තීරණය විය.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2026 වර්ෂය සාමූහිකව එකට එක්ක කටයුතු කිරීමට සියල්ලන්ටම සුභ ඇරයුමක් කරන ලදී.

(උ). කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවේලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස, ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරීම.

| | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් හා මං මාවත් ඉඩම් ගොඩනැගිලි | වෙනත් උපයෝගී සේවා | සුභ සාධන සේවා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 5 | 6 | |
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 01 වැටුප් දීමනා | 4,478,554.85 | 1,868,520.16 | 1,677,513.46 | 71,649.06 | 491,504.04 | 8,587,741.57 |
| 02 ගමන් වියදම් | 15,352.00 | 4,384.00 | 5,130.48 | - | - | 24,866.48 |
| 03 සැපයුම් හා උපකරණ | 119,351.00 | 448,582.00 | 18,987.50 | 144,867.43 | 50,730.00 | 782,517.93 |
| 04 ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තුව | 800.00 | 30,500.00 | - | - | - | 31,300.00 |
| 05 ප්‍රවාහන සම්බන්ධතා හා අවශ්‍යතා හා වෙනත් සේවා | 268,527.84 | 33,948.76 | - | 30,400.77 | 18,045.67 | 350,923.04 |
| 06 පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | | | - | - | - | - |
| 07 ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 79,200.00 | 2,084.16 | - | - | 11,100.00 | 92,384.16 |
| 08 විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 14,284.20 | | - | - | | 14,284.20 |
| **පුනරාවර්තන වියදම් එකතුව** | **4,976,069.89** | **2,388,019.08** | **1,701,631.44** | **246,917.26** | **571,379.71** | **9,884,017.38** |
| 09 ප්‍රාග්ධන වැය | - | | | - | - | - |
| 10 ණය ආපසු ගෙවීම් | - | | | - | - | - |
| **ප්‍රාග්ධන වැය එකතුව** | **-** | **-** | **-** | **-** | **-** | **-** |
| **පුනරාවර්තන වැය හා ප්‍රාග්ධන වියදම් වල මුළු එකතුව** | **4,976,069.89** | **2,388,019.08** | **1,701,631.44** | **246,917.26** | **571,379.71** | **9,884,017.38** |
| **සේවක ණය** | | | | | | |
| මහජන බැංකුව | - | | | | | - |
| ලංකා බැංකුව | 796,986.00 | | | | | 796,986.00 |
| ලංකා බැංකුව 8502324 | | | | | | - |
| තැන්පත් | 2,408,233.30 | | | | | 2,408,233.30 |
| විවිධ ණය හිමියෝ | 902,574.67 | | | | | 902,574.67 |
| ගබඩා ණය හිමියෝ | 626,384.35 | | | | | 626,384.35 |
| අත්තිකාරම් | 26,753.51 | | | | | 26,753.51 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| සමුච්චිත අරමුදල | - | | | | | - |
| ආයෝජන | - | | | | | - |
| වෙනත් ගෙවීම් | - | | | | | - |
| **මුළු එකතුව** | **9,737,001.72** | **2,388,019.08** | **1,701,631.44** | **246,917.26** | **571,379.71** | **14,644,949.21** |

(ඌ). ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සලකා බැලීම - නොවැම්බර්

**වියදම් සාරාංශය**

**ලැබීම් සාරාංශය**

| | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් හා මං මාවත් ඉඩම් ගොඩනැගිලි | වෙනත් උපයෝගී සේවා | සුභ සාධන සේවා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 5 | 6 | |
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 10 වරිපනම් බදු | 556,975.84 | 108,000.00 | - | - | 235,100.00 | 900,075.84 |
| 20 කුලී | - | 15,959.58 | 425,265.00 | 861,295.00 | 100,227.55 | 1,402,747.13 |
| 30 බලපත්‍ර සේවා | 211,195.50 | 1,381,311.39 | 5,030.00 | - | - | 1,597,536.89 |
| 40 සේවා සඳහා ගාස්තු | 103,906.00 | 693,025.00 | 146,360.00 | - | 2,345.00 | 945,636.00 |
| 50 වරෙන්තු සඳහා ගාස්තු | - | - | - | 8,360.00 | 3,128.00 | 11,488.00 |
| 60 වෙනත් ආදායම් | 3,998,089.20 | 46,390.00 | 22,000.00 | - | 870.00 | 4,067,349.20 |
| 70 වෙනත් ආදායම් | 3,511,134.75 | 1,347,300.15 | 1,274,336.80 | 48,091.62 | 393,174.39 | 6,574,037.71 |
| **පුනරාවර්තන ආදායම් එකතුව** | **8,381,301.29** | **3,591,986.12** | **1,872,991.80** | **917,746.62** | **734,844.94** | **15,498,870.77** |
| ප්‍රාග්ධන ආධාර 3-80 | - | - | - | - | - | - |
| 80 මූලණ ලැබීම් | - | - | - | - | - | - |
| එකතුව | - | - | - | - | - | - |
| **පුනරාවර්තන හා ප්‍රාග්ධන ආදායම් වල එකතුව** | **8,381,301.29** | **3,591,986.12** | **1,872,991.80** | **917,746.62** | **734,844.94** | **15,498,870.77** |
| සේවක ණය | | | | | | - |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මහජන බැංකුව - සේවක ණය | 55,400.00 | | | | | 55,400.00 |
| ලංකා බැංකුව - සේවක ණය | - | | | | | - |
| ලංකා බැංකුව 0008502324 | - | | | | | - |
| මහජන බැංකුව 101-1001-05116620 | - | | | | | - |
| තැන්පත් | 1,538,044.56 | | | | | 1,538,044.56 |
| සමුච්චිත අරමුදල | - | | | | | - |
| ශීර්ෂ ආදායම | 74,464.88 | | | | | 74,464.88 |
| අත්තිකාරම් | 39,589.61 | | | | | 39,589.61 |
| ආයෝජන ආපසු ලැබීම් | 1.00 | | | | | 1.00 |
| වෙනත් ලැබීම් | 2,674,559.77 | | | | | 2,674,559.77 |
| මුළු එකතුව | **12,763,361.11** | **3,591,986.12** | **1,872,991.80** | **917,746.62** | **734,844.94** | **19,880,930.59** |

අවසානය

අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනිමට සහය ලබා දුන් ආණ්ඩුපක්ෂයේ ගරු උපසභාපතිතුමා ප්‍රමුඛ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන්, ගරු මන්ත්‍රීවරියන්ටත් සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ස්තූතිය පුද කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 1.30 ට පමණ අවසන් කරන ලදි.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.